# 6

# රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු

## 6.1 සමස්ත නිරීක්ෂණ

සැලකිය යුතු කාලයක් මුළුල්ලේ ප්‍රගතියක් නොපෙන් වූ ආර්ථිකයෙහි උත්තේජනයක් ඇති කිරීම කෙරෙහි 2020 වසර ආරම්භයේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් මූලික අවධානය යොමු කෙරිණි. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතයෙන් සිදු වූ ආර්ථික බිඳ වැටීම සමස්ත රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කවලින් විතැන් වීමට හේතු වූ අතර, මෙම විතැන් වීම, රාජ්‍ය ආදායමේ පහත වැටීම සහ රාජ්‍ය පුනරාවර්තන වියදම් ඉහළ යෑම තුළින් හට ගත් අයවැය හිඟය පුළුල් වීම සහ මධ්‍යම රජයේ නොපියවූ ණය ඉහළ යෑම මගින් පිළිබිඹු විය. 2020 වසරේ අයවැය හිඟය පියවා ගැනීමේ දී දේශීය මූලාශ්‍ර මත වැඩි වශයෙන් රඳා පැවති අතර, අභියෝගාත්මක ගෝලීය වෙළඳපොළ තත්ත්වයන්ගේ බලපෑම හමුවේ අයවැය හිඟය මූල්‍යනය කිරීමේ දී විදේශීය මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට පැවති සීමා වීම මෙන්ම විදේශ මූල්‍යනය මත රඳා පැවතීම අවම කිරීමට රජය දැක්වූ කැමැත්ත මෙමගින් පිළිබිඹු වේ. මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 වසර සඳහා රාජ්‍ය මූල්‍ය අංශයේ තාවකාලික ඇස්තමේන්තුගත සංඛ්‍යාලේඛන, 2019 වසරෙන් ඉදිරියට ගෙන එන ලද නොපියවූ ගෙවීම් සඳහා අවශ්‍ය ගැළපීම් සිදු කර සකසා ඇත.[1] මේ අතර, 2020 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැයක් වසර ආරම්භය වන විට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන්, 2020 වසරේ දී රාජ්‍ය මූල්‍ය කටයුතු අතුරු සම්මත ගිණුම් (Votes-on-Account) සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (3) වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව අතිගරු ජනාධිපතිතුමාට හිමි ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීමේ බලතල යටතේ සිදු කෙරිණි. අතුරු සම්මත ගිණුම් සහ අතිගරු ජනාධිපතිතුමාගේ අවසරයෙන් සිදු වූ වියදම්වලින් සමන්විත 2020 වසර සඳහා වන වාර්ෂික අයවැය, 2020 වසරේ නොවැම්බර් මස දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. අතිශය අභියෝගකාරී අවස්ථා යටතේ, 2020 වසරේ පැවති සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ වුව ද, කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට රජය අඛණ්ඩව සහය දැක්වීය. රාජ්‍ය ආදායම සැලකිය යුතු පහළ මට්ටමක පැවතීම සහ විදේශීය ව්‍යවහාර මුදලින් ලබා ගත් ණය සඳහා ඉහළ ණය සේවාකරණ අවශ්‍යතා පැවතීම යන හේතූන් මත, රාජ්‍ය මූල්‍ය අංශය වෙත කෙටිකාලීනව ඉහළ අවදානමක් ඇති විය හැකිය. දීර්ඝ කාලයක් තිස්සේ අයවැය හිඟය අපේක්ෂිත ඉලක්කයෙන් විතැන් වීම සහ මධ්‍යම රජයේ නොපියවූ ණයවල ඉහළ යෑම හමුවේ, රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි අපේක්ෂිත පරිදි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව දැඩිව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පැන නැගී ඇත.

1 මෙම වාර්තාවේ විස්තර කර ඇති, 2019 සහ 2020 වර්ෂ සඳහා රාජ්‍ය ආදායම, වියදම සහ රාජ්‍ය මූල්‍ය ශේෂයන් සම්බන්ධ ඇස්තමේන්තුවලට මුදල් අමාත්‍යාංශයෙන් ලද දත්තවලට අනුව, නොපියවූ ගෙවීම් සඳහා සිදු කළ ගැළපීම ඇතුළත් වේ.

## 6.2 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග[2]

**2020 වසරේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දිශානතිය හා ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන් ඉලක්කගත වූයේ, ආර්ථික කටයුතු නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා පහසුකම් සලසමින් වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහය වීම කෙරෙහිය.** බදු අනුපාතික අඩු කිරීම මගින් ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අදහසින් 2020 වසර ආරම්භයේ දී රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රතිපත්ති ද කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා දායක විය. 2019 වසරේ නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයෙන් පසුව, 2020 අයවැය ඉදිරිපත් කිරීමේ දී ඇති වූ නොවැළැක්විය හැකි ප්‍රමාදයන් හේතුවෙන්, 2020 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැයක් 2020 වසරේ අග භාගය වන තෙක් නොපැවති හෙයින්, 2020 වසරේ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතු, අතුරු සම්මත ගිණුම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, අතිගරු ජනාධිපතිතුමාට හිමි ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීමේ බලතල යටතේ පවත්වාගෙන යන ලදී. අතුරු සම්මත ගිණුම් යටතේ සහ අතිගරු ජනාධිපතිතුමාට හිමි බලතල යටතේ සිදු කරන ලද වියදම් සහ අත්තිකාරම් මෙන්ම, ණය ගැනීම්වලට අදාළ අයවැය ප්‍රතිපාදන සියල්ල සමුච්චිතයක් ලෙස 2020 නොවැම්බර් මාසයේ දී පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරිණි. ඒ අනුව, 2020 වසර සඳහා වන අනුමත අයවැය ඇස්තමේන්තු, 2020 අංක 6 දරන විසර්ජන පනත[3] මගින් 2020 නොවැම්බර් මස 20 වන දින ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කෙරිණි. මේ අතර, 2021 වසර සඳහා වන විසර්ජන පනත 2020 දෙසැම්බර් මස 10 වන දින ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කෙරිණි. "රට හදන සෞභාග්‍යයේ දැක්ම" යන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙන් අපේක්ෂා කර ඇති ආකාරයට, දිළිඳුකම පිටුදැකීම සහ ආර්ථික පුනරුදය ඇති කිරීම සඳහා වන 2020-2025 මධ්‍යකාලීන වැඩසටහන ශක්තිමත් කිරීම කෙරෙහි වසර තුළ දී රජයේ අවධානය යොමු විය. ඒ අනුව, වෙළඳපොළ ආර්ථික රාමුවක් මගින් පහසුකම් සැලසෙන, නිෂ්පාදන සහ අපනයනාභිමුඛ ආර්ථිකයක් නිර්මාණය කිරීම තුළින් ජනතාවගේ ආර්ථික නිදහස තහවුරු කිරීම රජයේ අපේක්ෂාව විය. තවද, විවිධාංගීකරණය තුළින් අපනයන ඉපැයීම් ඉහළ නැංවීම සඳහා තුලිත වෙළඳ ප්‍රතිපත්තියක් ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් පියවීම සඳහා විදේශ විනිමය ගලා ඒම් සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාවය රජය විසින් අවධාරණය කරන ලදී. මීට අමතරව, රාජ්‍ය අයවැය මූල්‍යනය කිරීමේ දී රජයේ උපාය මාර්ගය වූයේ, වැඩි වශයෙන් දේශීය මූලාශ්‍ර මත රඳා පැවතීම වන අතර, එමගින් ඉදිරියේ දී විදේශීය වගකීම්වලට නිරාවරණය වීම අවම කිරීම අරමුණු කෙරේ.


**රජය විසින් මැදි කාලීනව තිරසාර හා ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගනු ලැබීම තහවුරු කිරීම කෙරෙහි රාජ්‍ය මූල්‍ය උපායමාර්ගය මගින් අවධානය යොමු කෙරිණි.** ආර්ථික හා සමාජීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම රජයේ සමස්ත සංවර්ධන මෙහෙයුමේ ඉතා වැදගත් අංගයක් ලෙස හඳුනාගෙන ඇත. මේ සඳහා මැදි කාලීනව රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, වසරකට සියයට 5.0 - 6.0ත් අතර ප්‍රමාණයක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි දක්වා ඇති පරිදි, සමාජයේ විවිධ අංශ අතර පවතින ආදායම් විෂමතාවය විසඳීමට රජය කැප විය. වසංගතය හේතුවෙන් ඇති වන අභියෝග මධ්‍යයේ වුව ද, මාර්ග, නිවාස, විදුලිය හා බලශක්තිය, අධ්‍යාපනය, විද්‍යාව හා තාක්ෂණය වැනි විවිධ ආර්ථික අංශවල යටිතලපහසුකම් වල පැවති හිඩැස් අවම කිරීම සඳහා රජය විසින් ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. විදේශීය අරමුදල් හරහා ක්‍රියාත්මක කිරීමට ඇති ව්‍යාපෘති, ජාතික සංවර්ධන ප්‍රමුඛතාවලට අනුව පෙළ ගැස්වීම සඳහා එකී ව්‍යාපෘති සමාලෝචනය කිරීමට රජය විසින් පියවර ගන්නා ලදී. එමෙන්ම, විදේශීය ආයෝජන මගින් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති හඳුනා ගැනීමට රජය විසින් පියවර ගන්නා ලද අතර, එමගින් රජයේ ණය බර අඩු කර ගැනීමට හැකි වනු ඇත. තවද, ජාතික ප්‍රතිපත්ති රාමුවට සහ 2021 වසර සඳහා වූ ජාතික අයවැයට අනුව, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් හඳුන්වා දීම සඳහා රජය වැඩි අවධානයක් යොමු කළ අතර, එමගින් ආර්ථික වර්ධනය සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ඉහළ නැංවෙනු ඇත.

**ව්‍යාපාර සහ පුද්ගල බදු බර අඩු කිරීම මගින් ආර්ථික ක්‍රියාකාරකම් යළි නගා සිටුවීමටත්, එමගින් ජනතාවගේ ආදායම ඉහළ නැංවීමටත් රජය විසින් පියවර ගන්නා ලදී.** 2019 වසරේ අග භාගයේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන බදු සංශෝධන අතරට ආදායම් බදු අනුපාත සහ එකතු කළ අගය මත බදු අනුපාතික

2 මෙම කොටසේ සාකච්ඡා කර ඇති ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, මෙම වාර්තාවේ 10 වන විශේෂ සටහන වන 'ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග' යන කොටසෙහි සවිස්තරව දක්වා ඇත.


3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (2) වගන්තිය යටතේ යෝජනා කර ඇති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (3) වගන්තිතය යටතේ යෝජනා සම්මත කර ඇති ඇතැම් වියදම් සහ අත්තිකාරම් 2020 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනතෙහි පළමු, දෙවන සහ තෙවන උපලේඛනයන් තුළ ඇතුළත් කර ඇති අතර, 150 (2) වගන්තිය යටතේ යෝජනා සම්මත කර ඇති ණය ගැනීම්, 2020 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනතෙහි 2 (1) (ආ) වගන්තිය යටතේ ඇතුළත් කර ඇත.

**6.1 රූප සටහන**
**රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය**




6

**6.2 රූප සටහන**
**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක**
**(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.

මූලයː මුදල් අමාත්‍යාංශය

අඩු කිරීම, එකතු කළ අගය මත බදු සඳහා වන බදු නිදහස් සීමාව ඉහළ නැංවීම සහ ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ආර්ථික සේවා ගාස්තු අහෝසි කිරීම ඇතුළත් වේ. මෙම පියවර මගින් රජයේ ආදායම සඳහා කෙටිකාලීනව අහිතකර බලපෑම් ඇති වුව ද, එමගින් ආර්ථික ක්‍රියාකාරකම්වලට ඉහළ පුනර්ජීවනයක් ලබා දීම රජයේ අපේක්ෂාව විය. ඒ අනුව, අඩු බදු අනුපාතික සමඟ ආර්ථික ක්‍රියාකාරකම්වල සිදු වනු ඇතැයි අපේක්ෂිත ප්‍රසාරණය මැදි කාලීනව පවත්වා ගෙන යැමේ සහ අපේක්ෂිත ඉහළ හා තිරසාර ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ලබමින්, රජයේ ආදායම් ඉපැයීම මැදි කාලීනව ඉහළ යනු ඇතැයි රජය අපේක්ෂා කෙරේ.

6

ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහන ලබා දෙන අතරම, බදු ව්‍යුහය සරල කිරීම ඉලක්ක කර ගනිමින්, 2019 වසර අග භාගයේ දී යෝජනා කරන ලද සංශෝධනවලට අනුකූලව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීමේ ක්‍රියාමාර්ග, 2020 වසරේ දී ප්‍රගතියක් පෙන්නුම් කළේය.[4] මෙම වාර්තාවේ 10 වන විශේෂ සටහන යටතේ 'ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි' විස්තර කර ඇති ආකාරයට පුද්ගලික ආදායම් බදු අනුපාත, බදු නිදහස් සීමාව සහ ආදායම් බදු කාණ්ඩ සඳහා සංශෝධන හඳුන්වා දෙන ලදී.

4 2019 වර්ෂයේ අග භාගයේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පරිදි, පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ව 2020 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන ලෙස බදු සංශෝධන ක්‍රියාත්මක කරන ලදී. ආර්ථික සේවා ගාස්තු අහෝසි කිරීම සම්බන්ධයෙන් 2020 අංක 4 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනත 2020 ඔක්තෝබර් මස 12 දින බලාත්මක කරන ලදී. තවද, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම් සඳහා වූ පනත් කෙටුම්පතක් 2021 මාර්තු මස 18 දින ගැසට් කරන ලදී.

**6.1 සංඛ්‍යා සටහන**
**රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය**

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|
| රුපියල් මිලියන | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **1,898,808** | **1,373,308** |
| මුළු ආදායම | 1,890,899 | 1,367,960 |
| බදු ආදායම | 1,734,925 | 1,216,542 |
| බදු නොවන ආදායම | 155,974 | 151,417 |
| ප්‍රදාන | 7,909 | 5,348 |
| **වියදම් සහ ශුද්ධ ණය දීම්** | **3,337,896** | **3,040,996** |
| පුනරාවර්තන | 2,424,582 | 2,548,359 |
| මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම | 123,428 | -123,428 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 913,314 | 492,638 |
| එයින් රාජ්‍ය ආයෝජන | 631,235 | 811,773 |
| මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම | 299,178 | -299,178 |
| **වර්තන ගිණුමේ ශේෂය** | **-533,683** | **-1,180,399** |
| **ප්‍රාථමික ශේෂය** | **-537,736** | **-687,386** |
| **සමස්ත අයවැය ශේෂය** | **-1,439,088** | **-1,667,688** |
| **මූල්‍යනය** | **1,439,088** | **1,667,688** |
| විදේශීය මූල්‍යනය | 542,641 | -83,199 |
| දේශීය මූල්‍යනය | 896,448 | 1,750,887 |
| ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ) | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **12.6** | **9.2** |
| මුළු ආදායම | 12.6 | 9.1 |
| බදු ආදායම | 11.6 | 8.1 |
| බදු නොවන ආදායම | 1.0 | 1.0 |
| ප්‍රදාන | 0.1 | 0.04 |
| **වියදම් සහ ශුද්ධ ණය දීම්** | **22.2** | **20.3** |
| පුනරාවර්තන | 16.1 | 17.0 |
| මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම | 0.8 | -0.8 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 6.1 | 3.3 |
| එයින් රාජ්‍ය ආයෝජන | 4.2 | 5.4 |
| මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම | 2.0 | -2.0 |
| **වර්තන ගිණුමේ ශේෂය** | **-3.6** | **-7.9** |
| **ප්‍රාථමික ශේෂය** | **-3.6** | **-4.6** |
| **සමස්ත අයවැය ශේෂය** | **-9.6** | **-11.1** |
| **මූල්‍යනය** | **9.6** | **11.1** |
| විදේශීය මූල්‍යනය | 3.6 | -0.6 |
| දේශීය මූල්‍යනය | 6.0 | 11.7 |

මූලයː මුදල් අමාත්‍යාංශය

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) 2019 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

2019 වසර අග භාගයේ සිට ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය සානුබල ක්‍රියාමාර්ග ශක්තිමත් කරමින්, කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ තවත් බදු සහන හඳුන්වා දෙනු ලැබූ අතර, එමගින් 2020 වසරේ දී ව්‍යාපාර හා පුද්ගලයින් වෙත වසංගතයෙන් ඇති කළ අහිතකර බලපෑම අවම කෙරිණි. 2019 වසරේ

අග භාගයේ දී ලබා දුන් විශාල සහනවලට අමතරව, තෝරා ගත් සෞඛ්‍ය ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම, වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්දෙන් සහ සෙස් බද්දෙන් නිදහස් කිරීම, රඳවා ගැනීමේ බදු සහ එකතු කළ අගය මත බදු ගෙවීමේ කාල සීමාවන් දීර්ඝ කිරීම සහ සමාජ හා ආර්ථික කටයුතු සීමා කරන ලද කාලය තුළ සියලුම බදු සඳහා දඩ මුදල් ගෙවීම නිදහස් කිරීම් පිළිබඳ උපදෙස් 2020 වසරේ දී හඳුන්වා දුන් ප්‍රධාන සහන අතරට ඇතුළත් විය. තවද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට 2018/2019 තක්සේරු වර්ෂය දක්වා නිකුත් කරන ලද තක්සේරු කිරීම් මත වූ නොගෙවූ හිඟ ආදායම් බදු මුදල්වලින් නිදහස් කිරීම, 2019/2020 වසර සඳහා අතිරේක තක්සේරු කිරීමක් නිකුත් නොකිරීම, හිඟ බදු/බදු පැහැර හැරීම් පියවීම සඳහා සහන කාලයක් ලබා දීම, මූල්‍ය කල්බදු හා වෙනත් ණය පහසුකම් යටතේ ගනුදෙනුකරුවන් ලබා ගත් ණය මුදල් ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු නොකළ අවස්ථාවක දී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් එම දේපළ අත්පත් කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන් වෙත නිකුත් කරන ලද වාහන අත්පත් කර ගැනීමේ නිවේදන දීර්ඝ කිරීම සහ බදු ගෙවීම් කිරීම සහ බදු වාර්තා සැපයීම සඳහා වන කාල නියමයන් දීර්ඝ කිරීම යනා දී විවිධ බදු සහන ලබා දුණි. 2021 වසර සඳහා වන ජාතික අයවැය මගින් බදු නිදහස් කිරීම, ඇතැම් ව්‍යාපාර සඳහා ආදායම් බදු අඩු කිරීම, බදු ගණනය කිරීම් සරල කිරීම සහ බදු පරිපාලනය බලාත්මක කිරීම ඇතුළු තවත් බදු ක්‍රියාමාර්ග යෝජනා කර ඇත.[5]

**වසංගතය මධ්‍යයේ ගෙවුම් ශේෂය සහ විනිමය අනුපාතිකය මත වූ පීඩන ලිහිල් කරමින් දේශීය වෙළඳපොළ තුළ ස්ථාවර මිල ගණන් පවත්වා ගැනීමේ අරමුණින් ජාත්‍යන්තර වෙළඳාමට අදාළ බදු සංශෝධන සිදු කෙරිණි.** ඒ අනුව, ආනයන බදු ඉහළ නැංවීම සඳහා සංශෝධන සිදු කරන ලද අතර, වර්ෂය තුළ දේශීය සිල්ලර මිල එකම මට්ටමක පවත්වා ගැනීම සඳහා පෙට්‍රල් සහ ඩීසල් ආනයනය කිරීම මත අධිභාරයක් පැනවීය. එසේම, දුම්කොළ නිෂ්පාදන ඇතුළු ඇතැම් භාණ්ඩ සඳහා ආනයන බදු සියයට 25-50 අතර පරාසයකින් ඉහළ නංවන ලදී. ආනයනික භාණ්ඩ සඳහා වන ආනයන බදු 2020 නොවැම්බර් 18 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි, සියයට 0, සියයට 15, සහ සියයට 30 යන අනුපාතවල සිට පිළිවෙළින් සියයට 0, සියයට 10, සහ සියයට 15 යන අනුපාත දක්වා සරල කෙරිණි. සෙස් බද්ද සහ වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද සඳහා ලබා දී ඇති බදු නිදහස් කිරීම්වලට අමතරව, දේශීය වෙළඳපොළ මිල ගණන්වල විචලනය අඩු කරමින් දේශීය නිෂ්පාදකයින්ට සහාය වීම සඳහා ඇතැම් අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය කෙරිණි.

**2020 වසරේ දී බදු පරිපාලනය ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් පියවර කිහිපයක් ආරම්භ කළේය.** ශ්‍රී ලංකා රේගුවේ රේගු දත්ත සඳහා වන ස්වයංක්‍රීය පද්ධතිය (Automated System for Customs Data) නවීකරණය කරමින් එහි ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලීන් වේගවත් කිරීම සිදු කෙරිණි. පුද්ගලිකව පෙනී සිටීමෙන් තොරව ශ්‍රී ලංකා රේගුවට ලේඛන ඉදිරිපත් කිරීමට ආනයනකරුවන්ට හැකි වන පරිදි රේගු දත්ත සඳහා වන ස්වයංක්‍රීය පද්ධතිය නවීකරණය කරන ලදී. ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (Integrated Treasury Management Information System) හරහා දෛනිකව රැස්කරන ආදායම්, මුදල් අමාත්‍යාංශයට වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ ආදායම් වාර්තා කිරීමේ මොඩියුලයක් ස්ථාපිත කරන ලදී. මහා භාණ්ඩාගාරයේ සියලුම දෙපාර්තමේන්තු, පාර්ලිමේන්තුව, ජාතික විගණන කාර්යාලය ඇතුළු වියදම් සිදු කරන ආයතන, 2020 වසරේ දී ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය සමඟ ඒකාබද්ධ වූ අතර, 2021 ජූනි මස සිට එම පද්ධතිය සමඟ තවත් වියදම් සිදු කරන ආයතන ඒකාබද්ධ වීමට නියමිතය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ආදායම් රැස් කිරීම ශක්තිමත් කිරීම සඳහා මංගත ගෙවීම් ක්‍රම ඔස්සේ විකල්ප බදු ගෙවීම් ක්‍රමයක් (Alternative Tax Payment System) හඳුන්වා දුන් අතර, බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක (Taxpayer Identification Numbers) නිකුත් කිරීම, ආනයනකරුවන් එකතු කළ අගය මත බදු සඳහා තාවකාලිකව ලියාපදිංචි කිරීම යනාදිය ඇතුළු පොදු සේවාවන් කිහිපයක් මංගත ගෙවීම් ක්‍රමයට සිදු කිරීමට කටයුතු කෙරිණි. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (Revenue Administration Management Information System) යටතේ මුද්දර බදු එකතු කිරීම ස්වයංක්‍රීයකරණය කිරීම 2020 වසරේ දී සම්පූර්ණ කෙරිණි.

**වාහන, ගොඩනැගිලි ආදිය මිලදී ගැනීම සඳහා වන වියදම් කප්පාදු කිරීම ඇතුළුව, රජයේ වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග 2020 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය.** වසංගතය මධ්‍යයේ දුර්වල වූ ආදායම් එක්

5 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පතක් 2021 මාර්තු 18 දින ගැසට් කරන ලදී.

6

රැස් කිරීමේ පසුබිම තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී. 2020 වසරේ දී අත්‍යවශ්‍ය නොවන වියදම් වළක්වා ගනිමින්, අදාළ ප්‍රතිපාදන තුළ වියදම් සීමා කරන ලෙසට සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට උපදෙස් ලබා දුණි. මේ අතර, විද්‍යුත් ප්‍රසම්පාදනය සහ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් සේවා ව්‍යාපෘතිය හඳුන්වා දීම ඇතුළුව, පද්ධති හා ක්‍රියාවලි ඩිජිටල්කරණය කිරීම නොකඩවා සිදු විය. තවද, රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද වැටුප් ව්‍යුහයන් නැවත සමාලෝචනය කිරීම සඳහා සහ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ දී රජයට උපදෙස් දීම සඳහා 2020 වසරේ පෙබරවාරි මාසයේ දී ජාතික වැටුප් කොමිෂන් සභාව පිහිටුවන ලදී.

**කොවිඩ්-19 වසංගතය අතරතුර කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ක්‍රමවේද හරහා විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කෙරිණි.** ජීවත්වීමේ සහතික විද්‍යුත් ක්‍රමයට නිකුත් කිරීමේ ව්‍යාපෘතිය 2020 වසරේ මුල් භාගයේ දී ආරම්භ කරන ලද අතර, එමගින් විශ්‍රාමිකයින්ට පවත්නා ප්‍රලේඛන ක්‍රියාවලිය වෙනුවට ඇඟිලි සලකුණු භාවිතයෙන් ඔවුන්ගේ ජීවත්වීමේ සහතික ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී තිබේ. විශ්‍රාමිකයන්ගේ ජීවත් වීම/පදිංචිය තහවුරු කිරීම සඳහා විද්‍යුත් ක්‍රමයට සෑම වසරකම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ජීවත්වීමේ සහතිකය යැවීමේ අවශ්‍යතාවය මෙයින් ඉවත් කෙරිණි. මීට අමතරව, බරපතල ශාරීරික හෝ මානසික දුබලතාවන්ගෙන් පීඩා විඳින විශ්‍රාමිකයින්ට පෞද්ගලිකව විශ්‍රාම වැටුප ලබා ගැනීමට නොහැකි අවස්ථාවල දී භාරකරුවෙකු පත් කිරීමට පහසුකම් සලසා ඇත. තව ද, ගෙවීම් ක්‍රියාවලියේ නිවැරදිබව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා වෙබ් අඩවිය පාදක කර ගත් වැඩසටහනක් හඳුන්වා දීම තුළින් වැන්දඹු සහ අනත්දරු (Widowers and Orphans) විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම සක්‍රීය කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරිණි.

**අඩු ආදායම්ලාභී කුටුම්භයන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සහ ආර්ථිකයට රාජ්‍ය අංශයේ දායකත්වය ඉහළ නැංවීමේ අරමුණින් රජය විසින් නව බඳවා ගැනීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.** අඩු ආදායම්ලාභී පවුල්වලින් නුපුහුණු පුද්ගලයන් 100,000ක් බඳවා ගැනීමේ අරමුණින්, රජය 2020 වසරේ ජනවාරි මාසයේ දී නව බඳවා ගැනීමේ වැඩසටහනක් ආරම්භ කළ අතර, පසුගිය තෙවසර ඇතුළත රැකියා විරහිතව සිටි රැකියා විරහිත උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් 50,000කට රැකියා අවස්ථා ලබා දීම සඳහා තවත් බඳවා ගැනීමේ වැඩසටහනක් 2020 වසරේ පෙබරවාරි මාසයේ දී ආරම්භ කරන ලදී. 2020 වසරේ අගෝස්තු මාසයේ දී මහ මැතිවරණය පවත්වන බව නිවේදනය කිරීමෙන් පසුව 2020 වසරේ මාර්තු මාසයේ දී මෙම බඳවා ගැනීමේ වැඩසටහන් තාවකාලිකව අත්හිටුවනු ලැබූ අතර, තවත් උපාධිධාරීන් 10,000 ක් බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව 2020 වසරේ සැප්තැම්බර් මස මුල දී එම බඳවා ගැනීමේ වැඩසටහන් නැවත ආරම්භ කරන ලදී.

**සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ මෙහෙයුම් විධිමත් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග සමඟ, රජයේ සුබසාධන වැඩසටහන් මගින් සමාජයේ අවශ්‍යතා ඇති කොටස් සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කෙරිණි.** කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, වකුගඩු රෝගීන්, ගොවීන් සහ අවතැන් වූ දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා රුපියල් 5,000ක දීමනාවක් 2020 වසරේ අප්‍රේල් සහ මැයි මාසවල දී ප්‍රදානය කෙරිණි. 2020 වසරේ දී කොවිඩ්-19 වසංගතය නිසා සමාජ හා ආර්ථික කටයුතු සීමා කර තැබූ කාලය තුළ දී සමෘද්ධි ප්‍රතිලාභීන්ට රුපියල් 10,000ක පොලී රහිත අත්තිකාරම් මුදලක් ලබා දීමට පියවර ගත් අතර, සාමාන්‍ය ජනතාවට උපයෝගිතා බිල්පත් ගෙවීම සඳහා මාසයක සහන කාලයක් ලබා දුණි. මීට අමතරව, කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ කටයුතුවල නිරතව සිටි පොලිස් නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, සෞඛ්‍ය අංශයේ නිලධාරීන් සහ අනෙකුත් රජයේ සේවකයින් සඳහා වූ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ඉහළ නැංවීමට කටයුතු සිදු කෙරිණි. රජයේ සුබසාධන වැඩසටහන් හා සම්බන්ධ තොරතුරු ගබඩා කරන විද්‍යුත් දත්ත ගබඩාවක් වන, සමාජ ආරක්ෂණ තොරතුරු ජාලයේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් සමෘද්ධි දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් මෙම වසරේ දී අත්සන් කරන ලදී. විවිධ සුභසාධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය ශක්තිමත් කිරීමට සමාජ ආරක්ෂණ තොරතුරු ජාලයේ ක්‍රියාකාරකම් අවසන් කොට එය ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියක් (Integrated Welfare Management System) දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂිතය. සමෘද්ධි ප්‍රතිලාභීන්ට ඔවුන්ගේ ආදායම ඉහළ නංවා ගෙන, සුභසාධන වැඩසටහනෙන් ඉවත් වීමට සහාය වීමට සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම අරමුණු කරගත් ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ ජාතික ක්‍රමෝපායික සැලැස්ම (Graduation Cell) පිහිටුවීමට සමෘද්ධි දෙපාර්තමේන්තුව අදහස් කරයි.

**මධ්‍යම රජය වෙත ඇති කරන මූල්‍යමය පීඩනය අවම කරමින්, රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ මූල්‍ය ශක්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ක්‍රියාත්මක කෙරිණි.** මෙම ආයතනවල මූල්‍ය ශක්‍යතාව ශක්තිමත් කිරීමේ අරමුණින්, රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ප්‍රධාන තනතුරු සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් පත් කිරීමට විශේෂ කමිටුවක් 2020 වසර මුල දී පිහිටු විය. දේශීය ඉන්ධන මිල සංශෝධනය නොකිරීමට වග බලා ගනිමින්, ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල අසාමාන්‍ය ලෙස පහත වැටීමේ ප්‍රතිලාභ ආර්ථිකය පුරා මෙන්ම, ජනතාව වෙත සාධාරණව බෙදා හැරීම සහතික කිරීම සඳහා ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල (Fuel Price Stabilisation Fund) පිහිටුවන ලදී. ඒ අනුව, 2020 වසරේ මාර්තු 23 වන දින මහ බැංකුවට භාණ්ඩාගාර බිල්පත් (මුහුණත වටිනාකම මත) නිකුත් කරමින්, රුපියල් බිලියන 50ක ආරම්භක ප්‍රාග්ධන අරමුදලකින් මෙම අරමුදල පිහිටු විය. පෙට්‍රල් සහ ඩීසල් ආනයන මත පනවනු ලැබූ අධිභාරයෙන් රැස් කරන ලද ආදායම මෙම අරමුදල වෙත මාරු කෙරිණි. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු හිඟ මුදල් පියවීම සඳහා 2020 වසරේ දී මෙම අරමුදල යම් ආකාරයකට උපයෝගී කර ගත් අතර, 2020 වසර අවසානයේ දී ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලෙහි ශේෂය රුපියල් මිලියන 379.1ක් ලෙස වාර්තා විය.

**කොවිඩ්-19 වසංගතය හමුවේ, රජය ලබා ගත් විදේශීය ණය ආපසු ගෙවීම්, විදේශීය මූල්‍යන සහ රාජ්‍ය මූල්‍ය ශේෂයන්ගේ පිරිහීම යන කරුණු මත තීව්‍ර වූ අවදානම් සඳහන් කරමින්, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් 2020 වසරේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළන ලදී.** 2020 වසරේ අප්‍රේල් සහ මැයි මාසවල දී ෆිච් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය (Fitch Ratings) සහ එස් ඇන්ඩ් පී ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය (S & P Global Ratings) විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් 'B-' දක්වා පහත හෙළනු ලැබූ අතර, ඉදිරි දැක්ම පිළිවෙළින් 'ඍණ' සහ 'ස්ථාවර' ලෙස තහවුරු කරන ලදී. 2020 වසරේ අප්‍රේල් මාසයේ දී, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම වූ 'B2' සම්බන්ධයෙන් සමාලෝචනයක් ආරම්භ කළ මූඩීස් ආයෝජක සේවාව විසින් (Moody's Investors Service), 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම 'Caa1' දක්වා මට්ටම් දෙකකින් පහත හෙළනු ලැබූ අතර, ඉදිරි දැක්ම 'ඍණ' සිට 'ස්ථාවර' දක්වා සංශෝධනය කරන ලදී. 2020 වසරේ නොවැම්බර් මාසයේ දී ෆිච් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම 'CCC' දක්වා පහත හෙළන ලදී. 2020 වසරේ දෙසැම්බර් මාසයේ දී, එස් ඇන්ඩ් පී ග්ලෝබල් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම 'CCC+' දක්වා පහත හෙළනු ලැබූ අතර, ඉදිරි දැක්ම 'ස්ථාවර' මට්ටමේ පවත්වා ගන්නා ලදී. ශ්‍රේණිගත කිරීමේ ආයතනවල අහිතකර සමපේක්ෂණ අපේක්ෂා නොතකමින්, 2020 වසරේ ඔක්තෝබර් 6 වන දින කල් පිරුණු එ.ජ. ඩොලර් බිලියන 1ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ඇතුළුව 2020 වසරේ සියලුම ණය සේවාකරණ ගෙවීම් රජය විසින් නිසි ලෙස පියවන ලදී.

## 6.3 රජයේ අයවැය කටයුතු


### ආදායම සහ ප්‍රදාන

#### ආදායම

**කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ඇති වූ මන්දගාමී ආර්ථික කාර්යසාධනය, 2019 වසර අග භාගයේ සිට ක්‍රියාත්මක කරන ලද බදු සංශෝධන සහ වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා ලබා දී ඇති බදු සහන යනාදියේ ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසර තුළ දී රාජ්‍ය ආදායම නාමික වශයෙන් සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පහළ ගියේය.** ඒ අනුව, මුළු ආදායම 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 1,890.9 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 1,368.0 දක්වා සියයට 27.7කින් පහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ආදායම් බදු,

6

**6.3 රූප සටහන**
**රාජ්‍ය ආදායමේ සංයුතිය - 2020**



මූලය: මුදල් අමාත්‍යාංශය

**6.2 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය ආදායම පිළිබඳ සම්පිණ්ඩනය**

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|
| රුපියල් මිලියන | | |
| **බදු ආදායම** | **1,734,925** | **1,216,542** |
| ආදායම් බදු | 427,700 | 268,249 |
| එකතු කළ අගය මත බදු | 443,877 | 233,786 |
| නිෂ්පාදන/සුරා බදු | 399,478 | 321,932 |
| ආනයන මත බදු | 98,427 | 114,183 |
| අනෙකුත් බදු | 365,443 | 278,392 |
| **බදු නොවන ආදායම** | **155,974** | **151,417** |
| **මුළු ආදායම** | **1,890,899** | **1,367,960** |
| ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ) | | |
| **බදු ආදායම** | **11.6** | **8.1** |
| ආදායම් බදු | 2.8 | 1.8 |
| එකතු කළ අගය මත බදු | 3.0 | 1.6 |
| නිෂ්පාදන/සුරා බදු | 2.7 | 2.2 |
| ආනයන මත බදු | 0.7 | 0.8 |
| අනෙකුත් බදු | 2.4 | 1.9 |
| **බදු නොවන ආදායම** | 1.0 | 1.0 |
| **මුළු ආදායම** | **12.6** | **9.1** |

මූලය: මුදල් අමාත්‍යාංශය

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.

(ආ) තාවකාලික

(ඇ) 2019 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, සෙස් බදු සහ නිෂ්පාදන බදු/සුරා බදුවලින් ලැබුණු අඩු ආදායම හේතුවෙන් සමස්ත බදු ආදායම 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 1,734.9 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 1,216.5 දක්වා සියයට 29.9කින් පහළ ගියේය. වසංගතය හමුවේ ව්‍යාපාර සහ පුද්ගලයින්ගේ ආදායම් තත්ත්වය අඩු වීමේ බලපෑම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින්, ඍජු බදු ආදායම මුළු බදු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවති සියයට 24.7 සිට 2020 වසරේ දී සියයට 22.1 දක්වා අඩු විය. 2020 වසරේ දී වක්‍ර බදු ආදායම මුළු බදු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 77.9ක් විය. රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් ලද ගාස්තු සහ අයකිරීම් සහ ලාභ හා ලාභාංශ මත ආදායම් රැස් කිරීම අඩු වීම පිළිබිඹු කරමින්, බදු නොවන ආදායම රුපියල් බිලියන 151.4 දක්වා සියයට 2.9කින් සුළු වශයෙන් පහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, බදු ආදායම 2019 වසරේ දී පැවති සියයට 11.6 සිට 2020 වසරේ දී සියයට 8.1 දක්වා අඩු වූ අතර, බදු නොවන ආදායම 2020 වසරේ දී සියයට 1.0ක නොවෙනස්ව පැවතීම පිළිබිඹු කරමින්, මුළු ආදායම 2019 වසරේ පැවති සියයට 12.6 සිට 2020 වසරේ දී සියයට 9.1 දක්වා පහළ ගියේය.

**2020 වසර තුළ දී ආදායම් බදුවලට අදාළ සියලුම කාණ්ඩවල බදු ආදායම්වල පහළ යෑම පිළිබිඹු කරමින්, ආදායම් බදු මගින් ලද ආදායම 2020 වසර තුළ දී නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද පහළ ගියේය.** ආදායම් බදු මගින් ලද ආදායම නාමික වශයෙන් 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 427.7 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 268.2 දක්වා සියයට 37.3කින් පහළ ගිය අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස එය 2019 වසරේ දී පැවති සියයට 2.8 සිට 2020 වසරේ දී සියයට 1.8 දක්වා පහළ ගියේය. 2020 වසරේ ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි, උපයන විට ගෙවීමේ බදු සහ ආර්ථික සේවා ගාස්තු ඉවත් කිරීම සමඟ, රඳවා ගැනීමේ බදු හා සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදුවලට සංශෝධන සිදු කිරීම ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන, ආදායම් බදු ආදායම පහළ ගියේය. උපයන විට ගෙවීමේ බද්ද වෙනුවට 2020 වසරේ අප්‍රේල් 01 දින සිට හඳුන්වා දෙන ලද අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද මගින් ලද ආදායම ද ඇතුළුව, 2019 මූල්‍ය වර්ෂය සඳහා අදාළ 2020 වසර තුළ දී එක්රැස් කරන ලද උපයන විට ගෙවීමේ බද්දෙන් ලද ආදායම, 2020 වසරේ දී රුපියල් බිලියන 15.0ක් විය. ඒ හා සැසඳීමේ දී 2019 වසරේ දී උපයන විට ගෙවීමේ බද්ද මගින් එකතු කරන ලද බදු ආදායම රුපියල් බිලියන 49.4ක අගයක් වාර්තා කළේය. 2019 මූල්‍ය වර්ෂය සඳහා සමුච්චිත නොගෙවූ හිඟ ශේෂ හේතුවෙන් 2020 වසර තුළ දී එක්රැස් කරන ලද ආර්ථික සේවා ගාස්තු මගින් ලද ආදායම, 2019 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 55.3ට සාපේක්ෂව 2020 වසරේ දී රුපියල් බිලියන 15.0ක අගයක් වාර්තා කළේය. රඳවා ගැනීමේ බදු සඳහා කළ සංශෝධන හේතුවෙන්, රඳවා ගැනීමේ බදු මගින් ලද ආදායම, 2019 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 50.4 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 10.0ක් දක්වා සැලකිය යුතු අඩු වීමක් වාර්තා කළේය. 2020 වසරේ ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධාන වශයෙන්, පුද්ගල ආදායම් බදු අනුපාත සහ සංස්ථාපිත ආදායම් බදු අනුපාත මත සිදු කළ සංශෝධන පිළිබිඹු කරමින්, 2020 වසරේ දී සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු මගින් ලද ආදායම, 2019 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 272.6 සිට රුපියල් බිලියන 228.3 දක්වා සියයට 16.2කින් පහළ ගියේය.

**ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ 2019 වසරේ දෙසැම්බර් 01 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 8 දක්වා අඩු කිරීම හමුවේ, එකතු කළ අගය මත බද්දෙන් සහ නිෂ්පාදන/සුරාබදු මගින් ලද**

6

**ආදායම පහත වැටුණි.** ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2020 වසරේ දී එකතු කළ අගය මත බදුවලින් ලැබෙන ආදායම සියයට 3.0 සිට සියයට 1.6 දක්වා පහත වැටුණු අතර, නාමික වශයෙන් ගත් කල, එකතු කළ අගය මත බදු ආදායම 2019 වසරේ දී රුපියල් බිලියන 443.9 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 233.8ක් දක්වා සියයට 47.3කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මත වන එකතු කළ අගය මත බදු ආදායම 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 274.0 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 148.1ක් දක්වා සියයට 46.0කින් පහත වැටුණු අතර, ආනයන මත වන එකතු කළ අගය මත බදු ආදායම 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 169.9 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 85.7ක් දක්වා සියයට 49.5කින් පහත වැටුණි. ප්‍රධාන වශයෙන්, මෝටර් වාහන සහ ඛනිජ තෙල් නිෂ්පාදන මත වන නිෂ්පාදන බදු ආදායම අඩු වීම හේතුවෙන්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, නිෂ්පාදන බදු ආදායම 2019 වසරේ පැවති සියයට 2.7ට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 2.2ක් දක්වා පහත වැටුණි. 2020 වසරේ දී අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම සඳහා පනවා ඇති සීමාවන් මධ්‍යයේ මෝටර් රථ ආනයනය සංකෝචනය වීම හේතුවෙන්, මෝටර් වාහන මත නිෂ්පාදන බදුවලින් ලද ආදායම, 2019 වසරේ පැවති රුපියල් බිලියන 130.4 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 48.8ක් දක්වා පහත වැටුණි. ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනයේ සාපේක්ෂව අඩු පරිමාව පිළිබිඹු කරමින්, ඛනිජ තෙල් නිෂ්පාදන මත වන නිෂ්පාදන බදු ආදායම 2019 වසරේ පැවති රුපියල් බිලියන 61.7 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 53.1 දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, 2019 වසරේ දෙසැම්බර් මාසයේ දී දුම්වැටි සහ මත්පැන් මත නිෂ්පාදන/සුරාබදු ඉහළ නංවමින් කළ සංශෝධන පිළිබිඹු කරමින්, සිගරට් සහ දුම්කොළ මත මෙන්ම, මත්පැන් මත වන නිෂ්පාදන/සුරාබදු ආදායම වර්ෂය තුළ දී ඉහළ නැගුණු අතර, එම ආදායම් පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ දී, පිළිවෙළින් රුපියල් බිලියන 94.3 සහ රුපියල් බිලියන 121.0 දක්වා, සියයට 8.0කින් සහ සියයට 4.8කින් ඉහළ ගියේය. මේ අතර, ජාතිය ගොඩනැඟීමේ බද්දට අදාළ එකතු කරන ලද හිඟ මුදල්, 2019 වසරේ දෙසැම්බර් මාසයේ දී ජාතිය ගොඩනැඟීමේ බද්ද අහෝසි කිරීමෙන් අනතුරුව, 2020 වසරේ දී රුපියල් බිලියන 2.4ක් ලෙස වාර්තා විය.

**2020 වසර තුළ දී ආනයන සංකෝචනය වුව ද, බදු සංශෝධනවල බලපෑම පිළිබිඹු කරමින්, ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ බදු ආදායම 2020 වසරේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.** 2020 වසරේ අප්‍රේල් මාසයේ සිට ඛනිජ තෙල් නිෂ්පාදන මත රේගු බදු ඉහළ යෑම සහ 2020 වසරේ මාර්තු සහ අප්‍රේල් මාසවල දී ඛනිජ තෙල් නිෂ්පාදන මත රේගු බදුවලට අදාළ බදු නිදහස් කිරීම ඉවත් කිරීම යන කරුණු යම්තාක් දුරකට හේතුකොටගෙන, ආනයන බදු ආදායම, 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 98.4 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 114.2ක් දක්වා ඉහළ ගියේය. විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතික ඉහළ දැමීමේ සංශෝධන හේතුවෙන්, විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම 2020 වසරේ දී රුපියල් බිලියන 82.7ක් දක්වා, සියයට 17.5කින් වැඩි විය. අත්‍යවශ්‍ය නොවන ආනයන මත සීමාවන් පැනවීම නිසා ආනයන සංකෝචනය වීම සහ සමහර අයිතමයන් සඳහා ලබා දුන් බදු සහන තිබියදීත්, සම්මත වරාය සහ ගුවන් තොටුපළ බදු අනුපාතිකය සියයට 7.5 සිට සියයට 10.0 දක්වා ඉහළ යෑම පිළිබිඹු කරමින්, වරාය සහ ගුවන් තොටුපළ බදු ආදායම 2019 වසරේ දී වූ රුපියල් 112.2ට සාපේක්ෂව 2020 වසරේ දී රුපියල් බිලියන 115.4ක් දක්වා ඉහළ ගියේය.

**2020 වසරේ දී බදු නොවන ආදායම නාමික වශයෙන් අඩු වූ අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස එය පෙර වසරට සාපේක්ෂව සියයට 1.0ක මට්ටමේ නොවෙනස්ව පැවතුණි.** නාමික වශයෙන් ගත් කල, බදු නොවන ආදායම 2019 වසරේ පැවති රුපියල් බිලියන 156.0 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 151.4ක් දක්වා පහත වැටුණි. කොවිඩ්-19 වසංගතය හමුවේ ප්‍රධාන වශයෙන් ගාස්තු හා අය කිරීම්වලින් ලැබෙන ආදායම අඩු වීම සහ රාජ්‍ය අංශයේ වාණිජ ව්‍යවසායයන්වලින් ලද ලාභ හා ලාභාංශ මාරු කිරීම් අඩු වීම, 2020 වසරේ දී බදු නොවන ආදායම නාමික වශයෙන් අඩුවීමට හේතු විය. ඒ අනුව, ගාස්තු සහ අය කිරීම් 2019 වසරේ පැවති රුපියල් බිලියන 73.9 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 47.4 දක්වා සියයට 35.9කින් පහත වැටුණු අතර, වාණිජ ව්‍යවසායයන්ගෙන් ලද ලාභ හා ලාභාංශ 2019 වසරේ පැවති රුපියල් බිලියන 27.9ට සාපේක්ෂව, 2020 වසරේ දී රුපියල් බිලියන 17.6ක් දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, සමාජ ආරක්ෂණ දායක මුදල්වලින් ලද ආදායම 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 29.0 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 32.4ක් දක්වා ද බදු කුලී හා පොලී ආදායම් 2019 වසරේ පැවති රුපියල් බිලියන 18.5 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 19.4ක් දක්වා ද ඉහළ ගියේය. 2020 වසරේ දී මහ බැංකුව විසින් රජය වෙත සිදු කරන ලද ලාභ හා පැවරුම් ප්‍රමාණය රුපියල් බිලියන 24.0ක් වූ අතර, 2019 වසරේ දී මහ බැංකුව සතුව එවැනි බෙදිය හැකි ලාභ හෝ පැවරුම් නොපැවතිණි.

6

## ප්‍රදාන

**බහු පාර්ශ්වීය සහ ද්වි පාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද මුළු විදේශීය ප්‍රදාන, 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 7.9 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 5.3 දක්වා අඩු විය.** ද්වි පාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද විදේශීය ප්‍රදාන 2019 වසරේ පැවති රුපියල් බිලියන 5.1 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 2.8 දක්වා පහළ ගිය අතර, බහු පාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද විදේශීය ප්‍රදාන 2019 වසරේ පැවති රුපියල් බිලියන 2.8 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 2.5 දක්වා පහළ ගියේය. ජපන් රජය, ආසියානු සංවර්ධන බැංකුව සහ එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2020 වසර තුළ දී ප්‍රදානයන් ලබා දුන් ප්‍රධාන සංවර්ධන හවුල්කරුවන් විය.

## වියදම් සහ ශුද්ධ ණය දීම්

**2020 වසරේ දී සිදු කළ 2019 වසරට අදාළ නොපියවූ හිඟ ගෙවීම් පියවීම වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් රුපියල් බිලියන 422.6ක මුදලක් නැවත 2019 වසරේ රජයේ වියදම් සහ ශුද්ධ ණය දීම්වලට ගළපන ලදී.** ඒ අනුව, 2020 වසරේ දී සිදු කරන ලද පුනරාවර්තන වියදම්වලින් රුපියල් බිලියන 123.4ක් 2019 වසරට එකතු කර ඇති අතර, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්වලින් රුපියල් බිලියන 299.2ක් 2019 වසරට එකතු කර ඇත. මෙම ගැළපීම් සමඟ, 2020 වසරේ දී රජයේ වියදම් සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී පැවති සියයට 22.2 (රුපියල් බිලියන 3,337.9) සිට සියයට 20.3 (රුපියල් බිලියන 3,041.0)ක් දක්වා පහළ ගියේය. ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී පැවති සියයට 6.1 (රුපියල් බිලියන 913.3) සිට 2020 වසර තුළ දී සියයට 3.3 (රුපියල් බිලියන 492.6)ක් දක්වා සැලකිය යුතු අඩු වීම, රජයේ වියදම් සහ ශුද්ධ ණය දීම් පහළ වැටීමට හේතු විය. කෙසේ වුවද, පුනරාවර්තන වියදම් 2019 වසර හා සැසඳීමේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 16.1 (රුපියල් බිලියන 2,424.6) සිට සියයට 17.0 (රුපියල් බිලියන 2,548.4)ක් දක්වා 2020 වසරේ දී වැඩි විය.

**2020 වසරේ දී පුනරාවර්තන වියදම් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, සහනාධාර හා පැවරුම්, වැටුප් හා වේතන හා පොලී ගෙවීම් සඳහා දැරීමට සිදු වූ වියදම් වැඩි වීමයි.** වර්තන පැවරුම් සහ සහනාධාර සඳහා වන වියදම නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද 2020 වසර තුළ දී ඉහළ ගිය අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු


### 6.3 සංඛ්‍යා සටහන
### රාජ්‍ය වියදම පිළිබඳ සම්පිණ්ඩනය

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|
| රුපියල් මිලියන | | |
| **පුනරාවර්තන වියදම්** | **2,424,582** | **2,548,359** |
| භාණ්ඩ හා සේවා වියදම | 848,278 | 974,351 |
| එයින් වැටුප් හා වේතන | 686,452 | 794,158 |
| පොලී ගෙවීම් | 901,353 | 980,302 |
| විදේශීය | 233,970 | 266,679 |
| දේශීය | 667,383 | 713,623 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 551,524 | 717,133 |
| එයින් කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 456,241 | 610,486 |
| සමෘද්ධි | 44,660 | 52,434 |
| විශ්‍රාම වැටුප් | 227,670 | 257,833 |
| පොහොර සහනාධාර | 34,966 | 36,687 |
| අනෙකුත් | 148,945 | 263,532 |
| මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම | 123,428 | -123,428 |
| **ප්‍රාග්ධන වියදම්** | **619,069** | **795,368** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 385,366 | 483,543 |
| ප්‍රාග්ධන පැවරුම් | 239,688 | 307,917 |
| අනෙකුත් | -5,985 | 3,907 |
| **ශුද්ධ ණය දීම්** | **-4,933** | **-3,552** |
| මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම | 299,178 | -299,178 |
| **ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්** | **913,314** | **492,638** |
| **මුළු වියදම සහ ශුද්ධ ණය දීම්** | **3,337,896** | **3,040,996** |
| ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ) | | |
| **පුනරාවර්තන වියදම්** | **16.1** | **17.0** |
| භාණ්ඩ හා සේවා වියදම | 5.7 | 6.5 |
| එයින් වැටුප් හා වේතන | 4.6 | 5.3 |
| පොලී ගෙවීම් | 6.0 | 6.5 |
| විදේශීය | 1.6 | 1.8 |
| දේශීය | 4.4 | 4.8 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 3.7 | 4.8 |
| එයින් කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 3.0 | 4.1 |
| සමෘද්ධි | 0.3 | 0.4 |
| විශ්‍රාම වැටුප් | 1.5 | 1.7 |
| පොහොර සහනාධාර | 0.2 | 0.2 |
| අනෙකුත් | 1.0 | 1.8 |
| මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම | 0.8 | -0.8 |
| **ප්‍රාග්ධන වියදම්** | **4.1** | **5.3** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 2.6 | 3.2 |
| ප්‍රාග්ධන පැවරුම් | 1.6 | 2.1 |
| අනෙකුත් | -0.04 | 0.03 |
| **ශුද්ධ ණය දීම්** | **-0.03** | **-0.02** |
| මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම | 2.0 | -2.0 |
| **ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්** | **6.1** | **3.3** |
| **මුළු වියදම සහ ශුද්ධ ණය දීම්** | **22.2** | **20.3** |

මූලය: මුදල් අමාත්‍යාංශය

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) 2019 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

**6.4 රූප සටහන**
**රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2020 (අ)**




(අ) 2020 වසරේ සිට 2019 වසරට විතැන් කරන ලද පුනරාවර්තන වියදම්වල නොපියවූ ගෙවීම්වලට අදාළ ගැලපීම්, සමස්ත පුනරාවර්තන වියදම්වල ප්‍රතිශතයක් ලෙස එහි සාපේක්ෂ කොටස් ගණනය කිරීමේ දී ඇතුළත් කර නොමැත.

මූලයː මුදල් අමාත්‍යාංශය

වූයේ, ගෘහස්ථ අංශයට සිදු කළ වර්තන පැවරුම් ඉහළ යාමය. විශ්‍රාම වැටුප් ගෙවීම්, සමාජ ආරක්ෂණය හා සමාජයේ ආර්ථික දුෂ්කරතා ඇති පිරිසට සහය වීමට ඇති කළ සුභසාධන යෝජනා ක්‍රම මෙන්ම, කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය නිසා බලපෑමට ලක් වූ කණ්ඩායම් සඳහා මුදල් ප්‍රදානය කිරීම සහ කොවිඩ්-19 ව්‍යාප්තිය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා සෞඛ්‍ය ආරක්ෂිත කටයුතු මත සිදු කළ අනපේක්ෂිත හා පෙර නොවූ විරූ ආකාරයේ වියදම් හේතුවෙන් ගෘහස්ථ අංශයට සිදු කළ වර්තන පැවරුම් හා සහනාධාර ඉහළ ගොස් ඇත. එසේම, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ අවදානමට ලක් වූ කණ්ඩායම් සඳහා මුදල් ප්‍රදාන සහ සෞඛ්‍ය සේවා සහ වෙනත් ඒ ආශ්‍රිත අරමුණු සඳහා කරන ලද වියදම් හේතුවෙන් අතිරේක වියදම් ඇති විය. රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා නව වැටුප් ව්‍යුහයක් 2016 වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමත් සමඟ අන්තර් දීමනාවක් අඛණ්ඩව මූලික වැටුපට ඇතුළත් කිරීම, 2019 වසරේ ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය අංශයේ සේවකයින්ට රුපියල් 2,500ක අන්තර්කාලීන දීමනාවක් මාසිකව ලබා දීම, රාජ්‍ය අංශයේ සේවකයින්ගේ සාමාන්‍යයෙන් සිදු වන වාර්ෂික වැටුප් වර්ධක වැඩි කිරීම සහ 2020 වසර තුළ දී නව බඳවා ගැනීම් සඳහා සිදු කළ වැටුප් ගෙවීම් යනාදිය 2020 වසර තුළ දී වැටුප් හා වේතන සඳහා වන වියදම ඉහළ යැමට හේතු විය. පුනරාවර්තන වියදම්වලින් විශාලතම අයිතමය වන පොලී ගෙවීම සඳහා වන වියදම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සහ නාමික වශයෙන් 2020 වසරේ දී වැඩි විය. මෙම වැඩි වීම දේශීය පොලී ගෙවීම්වලින් මෙන්ම, විදේශීය පොලී ගෙවීම්වලින් ද පිළිබිඹු විය. 2020 වසර තුළ දී මුළු පොලී ගෙවීම්වලින් සියයට 72.8ක් වන නොපියවූ දේශීය ණය මත වූ පොලී ගෙවීම් 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 667.4 සිට රුපියල් බිලියන 713.6ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. රජයේ සුරැකුම්පත් හා අනෙකුත් දේශීය පොලී අනුපාතික මත එලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ වැටීමේ බලපෑම ඉක්මවා යමින් ශුද්ධ දේශීය මූල්‍යකරණය ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නොපියවූ වාණිජ ණය මත පොලී ගෙවීම් ඉහළ යෑම ප්‍රධාන කරගෙන, විදේශීය ණය මත වූ පොලී ගෙවීම් 2020 වසරේ දී රුපියල් බිලියන 266.7ක් දක්වා සියයට 14.0කින් ඉහළ ගිය අතර, එය 2019 වසරේ දී රුපියල් බිලියන 234.0ක් විය. පොලී ගෙවීම් සමස්ත පුනරාවර්තන වියදමෙන් සියයට 38.5ක් වන අතර, එය 2020 දී රජයේ ආදායමෙන් සියයට 71.7ට සමාන වේ.

**ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ පැවති සියයට 6.1 සිට 2020 වසරේ දී සියයට 3.3 දක්වා පහළ ගියේය.** ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.0ක් වූ ප්‍රාග්ධන වියදම්වලට අදාළ නොගෙවූ හිඟ ගෙවීම් පියවීමත් සමඟ, රාජ්‍ය ආදායම පහළ යාම සහ පුනරාවර්තන වියදම්වල සැලකිය යුතු ඉහළ යාම හේතුවෙන් සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශයේ බලපෑම මෙම අඩු වීම තුළින් පිළිබිඹු කෙරේ.

## ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් සහ අයවැය හිඟය මූල්‍යනය

**කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ ආර්ථිකයේ සිදු වූ සංකෝචනය සමඟ රජයේ ආදායම පහත වැටීම සහ පුනරාවර්තන වියදම් ඉහළ යාම පිළිබිඹු කරමින්, 2020 වසරේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ පසුබෑමට ලක් විය.** මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛනවලට අනුව, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිඟය 2019 වසරට අදාළ වූ සියයට 9.6 (රුපියල් බිලියන 1,439.1) සිට 2020 වසරේ දී සියයට 11.1 (රුපියල් බිලියන 1,667.7) දක්වා ඉහළ ගියේය. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2019 වසරේ දී වාර්තා වූ සියයට 3.6 (රුපියල් බිලියන 533.7) සිට 2020 වසරේ දී සියයට 7.9 (රුපියල් බිලියන 1,180.4) දක්වා වැඩි විය. මේ අතර, සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම ඉවත් කිරීම මගින් රජයේ අභිමත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබිඹු කෙරෙන ප්‍රාථමික ශේෂයේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී වාර්තා කළ සියයට 3.6 (රුපියල් බිලියන 537.7) සිට 2020

6

වසරේ දී සියයට 4.6 (රුපියල් බිලියන 687.4) දක්වා වැඩි විය. විදේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කිරීමට තිබූ ප්‍රවේශයන් සීමා වීම, අතිශයින්ම අභියෝගාත්මක ගෝලීය තත්ත්වයන්ගේ බලපෑම සහ විදේශීය ණය බර කෙරෙහි අවධානය යොමු කරමින් අයවැය හිඟය මූල්‍යනය කිරීමට විදේශීය මූලාශ්‍ර මත රඳා පැවතීම සීමා කිරීමට තිබූ රජයේ අභිමතය හේතුවෙන්, 2020 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය කිරීමේ දී රජය වැඩි වශයෙන් දේශීය මූලාශ්‍ර මත රඳා පැවතුණි. මුදල් අමාත්‍යාංශයට අනුව, දේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2019 වසරේ දී වූ රුපියල් බිලියන 896.4 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 6.0)ට සාපේක්ෂව 2020 වසරේ දී රුපියල් බිලියන 1,750.9 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.7) වූ අතර, විදේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2019 වසරේ දී වූ රුපියල් බිලියන 542.6 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.6)ට සාපේක්ෂව 2020 වසරේ දී රුපියල් බිලියන 83.2 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.6)ක ශුද්ධ විදේශීය ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය.


## 6.4 රාජ්‍ය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

### මධ්‍යම රජයේ ණය

**නොපියවූ විදේශීය ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස පහළ ගිය ද, දේශීය ණය ප්‍රමාණය ඉහළ යෑම හේතු කොටගෙන, නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද 2020 වසර අග දී මධ්‍යම රජයේ ණය 2019 වසරට සාපේක්ෂව වැඩි විය.** රජයේ ආදායම පහළ යෑම සහ පුනරාවර්තන වියදම්වල සිදු වූ ඉහළ යෑම හේතුවෙන් රජය විසින් 2020 වසරේ දී සිදු කරන ලද ශුද්ධ මූල්‍යනයේ සැලකිය යුතු වැඩි වීම නිසා 2020 වසර අවසානය වන විට මධ්‍යම රජයේ ණය කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2020 වසරේ දී ඇති වූ අහිතකර වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ රජය විසින් විදේශීය මූලාශ්‍රයන් මගින් අයවැය හිඟය මූල්‍යනයට ප්‍රවේශ වීම සීමා වීම, විදේශීය ශුද්ධ ණය ආපසු ගෙවීමකට හේතු වූ අතර, කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය මධ්‍යයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ඵලදා අනුපාතික ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කළ එම බැඳුම්කරවල ආයෝජනය කිරීමට නේවාසික මූල්‍ය ආයතන යොමු වීම සහ අයවැය හිඟය මූල්‍යනය කිරීමට රජය වැඩි වශයෙන් දේශීය මූලාශ්‍ර මත රඳා පැවතීම යනාදිය ද නොපියවූ විදේශීය ණය පහළ යෑමට හේතු විය. මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2019 වසර අවසානයට පැවති රුපියල් බිලියන 13,031.5ට සාපේක්ෂව 2020 වසර අවසානයට රුපියල් බිලියන 15,117.2ක් දක්වා වැඩි විය. නොපියවූ මධ්‍යම රජයේ ණය ප්‍රමාණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2019 වසර අවසානයට පැවති සියයට 86.8ට[6] සාපේක්ෂව 2020 වසර අවසන් වන විට සියයට 101.0 දක්වා ඉහළ නැගුණි. 2020 වසරේ දී නාමික දළ දේශීය නිෂ්පාදිතයේ සිදු වූ සංකෝචනය ද, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය ප්‍රමාණය ඉහළ යෑමට හේතු විය. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකයේ සිදු වූ වෙනස නිසා විදේශ ණය රුපියල් බිලියන 355.7කින් ඉහළ යෑම ද, මධ්‍යම රජයේ නොපියවූ ණය වල සිදු වූ නාමික වැඩි වීම කෙරෙහි බලපෑවේය. මධ්‍යම රජයේ දේශීය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසර අවසන් වන විට පැවති සියයට 45.5 සිට 2020 වසර අවසන් වන විට සියයට 60.6 දක්වා ඉහළ ගිය අතර, මධ්‍යම රජයේ විදේශීය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසර අවසන් වන විට පැවති සියයට 41.3 සිට 2020 වසර අවසන් වන විට සියයට 40.4 දක්වා අඩු විය. මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ නොපියවූ දේශීය ණය ප්‍රමාණය 2019 වසර අවසානයේ පැවති සියයට 52.4 සිට 2020 වසර අවසානයේ දී සියයට 60.0 දක්වා වැඩි වූ අතර, මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය ප්‍රමාණය 2019 වසර අවසානයේ පැවති සියයට 47.6 සිට 2020 වසර අවසානයේ දී සියයට 40.0 දක්වා අඩු විය. මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, ඇතැම් ණය

6 මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 වසරේ සිට 2019 වසරට විතැන් කරන ලද නොපියවූ හිඟ ගෙවීම් 2019 වසරේ අයවැය හිඟය මූල්‍යනය කිරීමට ඇතුළත් කළහොත් 2019 වසරේ අවසානයට මධ්‍යම රජයේ ණය සංඛ්‍යාලේඛන ඉහළ යා හැකිය. කෙසේ වෙතත්, එවැනි ගැළපීමක් මගින් 2020 වසර අවසානයට පවත්නා නොපියවූ මධ්‍යම රජයේ ණය සඳහා බලපෑමක් ඇති නොවේ.

**6.5 රූප සටහන**
**මධ්‍යම රජයේ නොපිය වූ ණය**




(අ) සංශෝධිත

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

6

### 6.4 සංඛ්‍යා සටහන
### මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේදී)

රුපියල් මිලියන

| ශීර්ෂය | 2017 | 2018 | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|---|---|
| **මුළු රාජ්‍ය ණය** | **10,382,832** | **12,030,548** | **13,031,543** | **15,117,247** |
| **දේශීය ණය (ඇ)** | **5,664,215** | **6,071,001** | **6,830,260** | **9,065,068** |
| කල්පිරීමේ කාලය අනුව | | | | |
| කෙටිකාලීන | 1,031,181 | 1,134,553 | 1,270,374 | 2,197,594 |
| මැදි හා දිගුකාලීන | 4,633,033 | 4,936,447 | 5,559,887 | 6,867,473 |
| ආයතන අනුව (ඈ) | | | | |
| බැංකු | 2,361,254 | 2,321,802 | 2,888,451 | 4,735,738 |
| බැංකු නොවන | 3,302,961 | 3,749,199 | 3,941,809 | 4,329,330 |
| **විදේශීය ණය** | **4,718,618** | **5,959,547** | **6,201,283** | **6,052,179** |
| ණය වර්ගය අනුව | | | | |
| සහනදායී ණය | 2,130,482 | 2,705,836 | 2,767,459 | 2,988,113 |
| සහනදායී නොවන ණය | 2,588,135 | 3,253,711 | 3,433,824 | 3,064,066 |
| ද්වි පාර්ශ්වීය | 243,581 | 58,586 | 112,943 | 156,252 |
| බහු පාර්ශ්වීය | 316,626 | 209,970 | 198,733 | 184,051 |
| වාණිජ ණය | 2,027,928 | 2,985,156 | 3,122,148 | 2,723,763 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 1,475,049 | 2,220,411 | 2,343,777 | 1,796,579 |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් | 217,054 | 330,174 | 242,191 | 279,612 |
| භාණ්ඩාගාර බිල්පත් වල අනේවාසිකයන්ගේ ආයෝජන | 27,552 | 11,909 | 23,727 | 670 |
| භාණ්ඩාගාර බැඳුම්කර වල අනේවාසිකයන්ගේ ආයෝජන | 295,059 | 146,914 | 80,294 | 6,204 |
| වෙනත් | 13,215 | 275,747 | 432,159 | 640,698 |
| ව්‍යවහාර මුදල් අනුව | | | | |
| වි.ගැ.හි. | 829,537 | 954,761 | 927,372 | 970,714 |
| එ.ජ. ඩොලර් | 2,650,431 | 3,781,626 | 4,076,588 | 3,875,950 |
| ජපාන යෙන් | 516,218 | 622,852 | 624,956 | 664,291 |
| යූරෝ | 208,075 | 225,831 | 228,713 | 251,406 |
| වෙනත් | 514,356 | 374,477 | 343,653 | 289,818 |
| **මධ්‍යම රජයේ ණය / ද.දේ.නි. (ඉ)** | **77.9** | **84.2** | **86.8** | **101.0** |
| විශේෂිත අයිතමයන් | | | | |
| විනිමය අනුපාතයේ මුළු විචලනය | 225,223 | 1,063,218 | 12,401 | 355,663 |
| විදේශීය ණය මත | 211,868 | 963,181 | 16,857 | 329,895 |
| විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කළ දේශීය ණය මත | 13,355 | 100,037 | -4,456 | 25,767 |

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2014 වසරේ දී ජා.මූ.අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත.

(ආ) තාවකාලික

(ඇ) 2013 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකන් ගුවන් සමාගමට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දින කල්පිරුණි.) සහ 2012 ජනවාරි මාසයේ දී රජයේ ආයතන විසින් ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778 ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662 කි.) ඇතුළත් වේ.

(ඈ) ව්‍යාපාර සහ පුද්ගලයින් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන සඳහා වන ගැළපීම් හේතුවෙන් බැංකු සහ බැංකු නොවන අංශ යටතේ පැවති දේශීය ණයවල සංයුතිය 2017 වසරේ සිට සංශෝධනය කරන ලදී.


(ඉ) 2018 සහ 2019 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

කළමනාකරණ දර්ශක මැදි කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය යටතේ සකස් කර ඇති පාදක දර්ශක අගයයන් අභිබවමින් ප්‍රගතියක් වාර්තා කර ඇත. මේ අනුව, 2020 වසර අවසානය වන විට, සමස්ත ණයෙහි ප්‍රතිශතයක් ලෙස විදේශීය මුදලින් නාමනය කළ ණය ප්‍රමාණය 2018 පාදක වර්ෂයේ පැවති සියයට 54.0 සිට සියයට 47.5 දක්වා අඩු වී ඇති අතර, විදේශීය මුදලින් නාමනය කළ ණය කළඹෙහි කල්පිරීමේ සාමාන්‍ය කාලය 2018 පාදක වර්ෂයේ පැවති වසර 6.60 සිට වසර 6.72 දක්වා ඉහළ ගොස් ඇත.

**දේශීය මූල්‍යනයේ ඉහළ යෑම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින්, මධ්‍යම රජයේ සමස්ත නොපියවූ දේශීය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2019 වසර අවසානයේ දී පැවති සියයට 45.5 සිට 2020 වසර අවසානයේ දී සියයට 60.6 දක්වා වැඩි විය.**

6

**6.6 රූප සටහන**
**මධ්‍යම රජයේ නොපිය වූ දේශීය ණය සංයුතිය - 2020**





නාමික වශයෙන් ගත් කල, සියයට 32.7කින් සැලකිය යුතු ලෙස ඉහළ යමින් 2019 වසර අග දී රුපියල් බිලියන 6,830.3ක් ලෙස පැවති දේශීය ණය ප්‍රමාණය 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 9,065.1ක් දක්වා ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, නොපියවූ භාණ්ඩාගාර බිල්පත්වල වැඩි වීම හේතුවෙන්, සමස්ත දේශීය ණය කළඹෙහි ප්‍රතිශතයක් ලෙස කෙටි කාලීන ණය ප්‍රමාණය 2019 වසර අග දී පැවති සියයට 18.6 සිට 2020 වසරේ දී සියයට 24.2 දක්වා වැඩි විය. භාණ්ඩාගාර බිල්පත් මාර්ගයෙන් ලබා ගත් නොපියවූ සමස්ත ණය ප්‍රමාණය සියයට 85.4ක වර්ධනයක් පෙන්නුම් කරමින්, 2019 වසර අවසානය වන විට පැවති රුපියල් බිලියන 873.9ට සාපේක්ෂව 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 1,620.7ක් දක්වා වැඩි විය. දේශීය ණය කළඹෙහි ප්‍රධාන ණය මූලාශ්‍රය ලෙස අඛණ්ඩව පවතින භාණ්ඩාගාර බැඳුම්කර මාර්ගයෙන් ලබා ගත් ණය ශේෂය සමස්ත දේශීය ණයවල ප්‍රතිශතයක් ලෙස 2019 වසර අග දී පැවති සියයට 67.4 (රුපියල් බිලියන 4,606.2)ට සාපේක්ෂව, 2020 වසර අග දී සියයට 63.0 (රුපියල් බිලියන 5,713.3) ලෙස පැවතුණි. 2020 වසර අවසානයේ දී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලබා ගත් නොපියවූ ණය, 2019 වසර අවසන් වන විට පැවති රුපියල් බිලියන 559.3ට සාපේක්ෂව 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 486.9ක් දක්වා අඩු වූ අතර, අක්වෙරළ බැංකු ඒකක මගින් ලබා ගත් නොපියවූ ණය ප්‍රමාණය 2019 වසර අග දී පැවති රුපියල් බිලියන 168.0ට සාපේක්ෂව 2020 වසර අග දී රුපියල් බිලියන 227.4ක් දක්වා වැඩි විය. මහ බැංකුව සහ වාණිජ බැංකු වෙත වූ නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණයේ සැලකිය යුතු වැඩි වීම පිළිබිඹු කරමින්, මධ්‍යම රජය මගින් දේශීය බැංකු අංශයට ගෙවිය යුතු නොපියවූ ණය ප්‍රමාණය සියයට 64.0ක සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරමින්, 2019 වසර අග පැවති රුපියල් බිලියන 2,888.5 සිට 2020 වසර අග දී රුපියල් බිලියන 4,735.7ක් දක්වා ඉහළ ගිය අතර, එය නොපියවූ සමස්ත දේශීය ණය කළඹෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 52.2ක් විය. බැංකු නොවන අංශයෙන් ලබා ගත් දේශීය ණය ප්‍රමාණය සියයට 9.8ක වැඩි වීමක් පිළිබිඹු කරමින්, 2019 වසර අග දී පැවති රුපියල් බිලියන 3,941.8 සිට 2020 වසර අග දී රුපියල් බිලියන 4,329.3 දක්වා වැඩි වූ අතර, එය දේශීය ණයවලින් සියයට 47.8ක් විය. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිසි ලෙස පියවීම හේතුවෙන්, විදේශීය ව්‍යවහාර මුදලින් ලබා ගත් දේශීය ණය ප්‍රමාණය 2019 වසර අවසානයට පැවති රුපියල් බිලියන 728.2 (එ.ජ. ඩොලර් මිලියන 4,009.4) සිට 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 719.3 (එ.ජ. ඩොලර් මිලියන 3,858.6) දක්වා අඩු විය. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මාර්ගයෙන් ලබා ගත් නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය 2019 වසර අවසානය වන විට පැවති රුපියල් බිලියන 560.2 (එ.ජ. ඩොලර් මිලියන 3,084.4) සිට 2020 වසර අවසානයට රුපියල් බිලියන 491.9 (එ.ජ. ඩොලර් මිලියන 2,638.6) දක්වා අඩු විය.[7] අක්වෙරළ බැංකු ඒකක මගින් ලබා ගත් නොපියවූ ණය ප්‍රමාණය 2019 වසර අවසානය වන විට පැවති රුපියල් බිලියන 168.0 (එ.ජ. ඩොලර් මිලියන 925.0) සිට 2020 වසර අවසානයට රුපියල් බිලියන 227.4 (එ.ජ. ඩොලර් මිලියන 1,220.0) දක්වා වැඩි විය.

**2020 වසර තුළ දී, විදේශීය මූල්‍යනය සඳහා පැවති සීමිත ප්‍රවේශය මධ්‍යයේ ශුද්ධ විදේශීය ණය ආපසු ගෙවීමේ බලපෑම පිළිබිඹු කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසර අග වන විට මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය 2019 වසරේ අග වන විට පැවති සියයට 41.3 සිට සියයට 40.4 දක්වා අඩු විය.** නාමික වශයෙන් ගත් කල, 2020 වසර අග වන විට මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය ප්‍රමාණය 2019 වසර අග වන විට පැවති රුපියල් බිලියන 6,201.3ට සාපේක්ෂව රුපියල් බිලියන 6,052.2 දක්වා අඩු විය. 2020 වසර අග වන විට විදේශීය වාණිජ ණය ගැනීම් ඇතුළුව නොපියවූ සහනදායී නොවන ණය ප්‍රමාණය, 2019 වසර අග වන විට පැවති රුපියල් බිලියන 3,433.8 සිට රුපියල් බිලියන 3,064.1 දක්වා සියයට 10.8කින් අඩු විය. 2020 වසර අග වන විට සමස්ත විදේශීය ණය ප්‍රමාණයෙන් සහනදායී නොවන ණය ප්‍රමාණය 2019 වසර අග වන විට පැවති සියයට 55.4 සිට සියයට 50.6 දක්වා අඩු විය. සහනදායී නොවන ණය

7 විදේශීය ව්‍යවහාර මුදලින් ලබා ගත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අනේවාසිකයින් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ නේවාසිකයින් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර යන දෙවර්ගයම ඇතුළත් වේ.

**6.7 රූප සටහන**
**මධ්‍යම රජයේ නොපිය වූ විදේශීය ණය සංයුතිය - 2020**





මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 2020 වසරේ ඔක්තෝබර් මස පැවති එ.ජ. ඩොලර් බිලියන 1.0 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර පියවීම ඇතුළු විදේශීය වාණිජ ණය පියවීම්ය. 2020 වසර අග වන විට නොපියවූ විදේශීය සහනදායී ණය ප්‍රමාණය 2019 වසර අග වන විට පැවති රුපියල් බිලියන 2,767.5 සිට රුපියල් බිලියන 2,988.1 දක්වා සියයට 8.0කින් වැඩි වූ අතර, එය සමස්ත විදේශීය ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 2019 වසර අග වන විට පැවති සියයට 44.6ට සාපේක්ෂව 2020 වසර අග වන විට සියයට 49.4ක් විය.

විදේශීය ණය නාමනය කළ විදේශීය ව්‍යවහාර මුදල්වලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ අගයෙහි සිදු වූ විචලනය මගින් විදේශීය මුදලින් නාමනය කළ මධ්‍යම රජයේ නොපියවූ ණය මත සිදු කරන ලද බලපෑම හේතුවෙන්, මධ්‍යම රජයේ නොපියවූ ණයෙහි රුපියල් අගය 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 355.7කින් වැඩි විය. මෙම වැඩි වීම සඳහා, නොපියවූ විදේශීය ණය මත විනිමය අනුපාතය වෙනස් වීම හේතුවෙන් ඇති වූ රුපියල් බිලියන 329.9ක සහ නොපියවූ විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද දේශීය ණය (එනම්, එ.ජ. ඩොලර් මගින් තක්සේරු කරන ලද දේශීය ණය ප්‍රමාණය) මත විනිමය අනුපාතය වෙනස් වීම හේතුවෙන් ඇති වූ රුපියල් බිලියන 25.8ක බලපෑම හේතු විය. 2020 වසර අවසානය වන විට විනිමය අනුපාතය වෙනස් වීම නිසා සිදු වූ මෙම බලපෑමට එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල සියයට 2.6කින් අවප්‍රමාණය වීම, ප්‍රධාන වශයෙන් දායක විය. විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ණය ගෙවීම් රජයට ගලා එන විදේශීය ව්‍යවහාර මුදල්වලින් සිදු කෙරෙන බැවින්, නොපියවූ විදේශීය ව්‍යවහාර

**6.8 රූප සටහන**
**ව්‍යවහාර මුදල් වර්ගය අනුව මධ්‍යම රජයේ සමස්ත නොපිය වූ ණය සංයුතිය - 2020**




මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් ණය මත රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම නාමික වැදගත්කමක් පමණක් වනු ඇත. කෙසේ වෙතත්, වසංගතය හමුවේ 2020 වසරේ දී රජයට විදේශ විනිමය ගලා ඒම්වල සිදු වූ පහත වැටීම මධ්‍යයේ, 2020 වසරේ දී ණය සේවාකරණ අරමුණු සඳහා විදේශ විනිමය මහ බැංකුවෙන් මිලට ගැනීම සඳහා සැලකිය යුතු රුපියල් අරමුදල් ප්‍රමාණයක් රජය උපයෝගී කරගත් බව සැලකිය යුතු වේ.

## මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්

පොලී ගෙවීම්වල ඉහළ යාමක් පැවතිය ද, ණය ආපසු ගෙවීම්වල පහළ යාම හේතුවෙන්, මධ්‍යම රජයේ සමස්ත ණය සේවාකරණ ගෙවීම් 2019 වසරේ පැවති රුපියල් බිලියන 2,022.5 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 1,941.4ක් දක්වා පහත වැටුණි. ප්‍රධාන වශයෙන්, භාණ්ඩාගාර බැඳුම්කර මාර්ගයෙන්

**6.5 සංඛ්‍යා සටහන**
**මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්**

රුපියල් මිලියන


| ශීර්ෂය | 2017 | 2018 | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|---|---|
| **ණය සේවාකරණ ගෙවීම්** | **1,603,049** | **2,088,551** | **2,022,507** | **1,941,373** |
| දේශීය | 1,213,498 | 1,561,363 | 1,213,698 | 1,169,522 |
| විදේශීය | 389,551 | 527,188 | 808,809 | 771,851 |
| **ණය ආපසු ගෙවීම්** | **867,484** | **1,236,361** | **1,121,155** | **961,071** |
| දේශීය | 642,875 | 921,881 | 546,315 | 455,899 |
| විදේශීය | 224,609 | 314,480 | 574,839 | 505,172 |
| **පොලී ගෙවීම්** | **735,566** | **852,190** | **901,353** | **980,302** |
| දේශීය | 570,623 | 639,482 | 667,383 | 713,623 |
| කෙටි කාලීන | 81,275 | 74,525 | 81,029 | 77,965 |
| මැදි හා දිගු කාලීන | 489,348 | 564,957 | 586,354 | 635,658 |
| විදේශීය | 164,942 | 212,708 | 233,970 | 266,679 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

6

**6.9 රූප සටහන**
**මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ලබා ගත් ණයවල කල්පිරීම් මෙම වසර තුළ දී පහත වැටීම හේතුවෙන්, දේශීය ණය ආපසු ගෙවීම් 2019 දී පැවති රුපියල් බිලියන 546.3 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 455.9ක් දක්වා සියයට 16.6කින් පහත වැටුණි. ප්‍රධාන වශයෙන්, 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,500ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීම්වලට එරෙහිව, 2020 දී එ.ජ. ඩොලර් මිලියන 1,000ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීම් පිළිබිඹු කරමින්, විදේශීය ණය ආපසු ගෙවීම් 2019 දී පැවති රුපියල් බිලියන 574.8 සිට 2020 දී රුපියල් බිලියන 505.2ක් දක්වා සියයට 12.1කින් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත ණය සේවාකරණ ගෙවීම්වලින් සියයට 49.5ක් වූ මුළු ණය ආපසු ගෙවීම්, 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 1,121.2 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 961.1ක් දක්වා සියයට 14.3කින් පහත වැටුණි. කෙසේ වුව ද, නොපියවූ දේශීය ණය සහ විදේශීය ණය යන දෙවර්ගයම මත සිදු කළ පොලී ගෙවීම් වැඩිවීම හේතුවෙන්, 2019 වසරේ දී වූ රුපියල් බිලියන 901.4 සිට 2020 දී රුපියල් බිලියන 980.3ක් දක්වා සියයට 8.8කින් සමස්ත පොලී ගෙවීම් ඉහළ ගියේය. රජයේ සුරැකුම්පත්වලට අදාළ ඵලදා අනුපාතික ඇතුළු දේශීය පොලී අනුපාතික පහළ ගිය ද, නොපියවූ දේශීය ණයෙහි සැලකිය යුතු ඉහළ යාම හේතුවෙන්, මධ්‍යම රජයේ දේශීය ණය මත වන පොලී ගෙවීම් 2019 වසරේ දී රුපියල් බිලියන 667.4 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 713.6ක් දක්වා සියයට 6.9කින් ඉහළ ගියේය. විනිමය අනුපාත වෙනස් වීමේ බලපෑමත් සමඟ, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර

**6.6 සංඛ්‍යා සටහන**
**මධ්‍යම රජයේ ණය දර්ශක**

| දර්ශකය | 2017 | 2018 (අ) | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|---|---|
| මධ්‍යම රජයේ ණය/ද.දේ.නි. | 77.9 | 84.2 | 86.8 | 101.0 |
| දේශීය ණය/ද.දේ.නි. (ඇ) | 42.5 | 42.5 | 45.5 | 60.6 |
| විදේශීය ණය/ද.දේ.නි. | 35.4 | 41.7 | 41.3 | 40.4 |
| දේශීය ණය/මධ්‍යම රජයේ ණය | 54.6 | 50.5 | 52.4 | 60.0 |
| විදේශීය ණය/මධ්‍යම රජයේ ණය | 45.4 | 49.5 | 47.6 | 40.0 |
| විදේශීය ණය/අපනයන (ඈ) | 162.2 | 181.0 | 178.6 | 250.2 |
| ණය සේවාකරණ/ද.දේ.නි. | 12.0 | 14.6 | 13.5 | 13.0 |
| ණය සේවාකරණ/රජයේ ආදායම | 87.5 | 108.8 | 107.0 | 141.9 |
| එයින් දේශීය ණය සේවාකරණ/රජයේ ආදායම | 66.3 | 81.3 | 64.2 | 85.5 |
| ණය සේවාකරණ ගෙවීම්/රජයේ වියදම (ඉ) | 46.6 | 53.1 | 45.4 | 48.5 |
| එයින් දේශීය ණය සේවාකරණ/රජයේ වියදම (ඉ) | 35.3 | 39.7 | 27.2 | 29.2 |
| විදේශීය ණය සේවාකරණ/අපනයන (ඈ) | 13.4 | 16.0 | 23.3 | 31.9 |
| ණය පොලී ගෙවීම්/ද.දේ.නි. | 5.5 | 6.0 | 6.0 | 6.5 |
| ණය පොලී ගෙවීම්/රජයේ වියදම | 21.4 | 21.7 | 20.2 | 24.5 |
| දේශීය ණය පොලී ගෙවීම්/ද.දේ.නි. | 4.3 | 4.5 | 4.4 | 4.8 |
| විදේශීය ණය පොලී ගෙවීම්/ද.දේ.නි. | 1.2 | 1.5 | 1.6 | 1.8 |
| ණය පොලී ගෙවීම්/ රජයේ පුනරාවර්තන වියදම් | 38.2 | 40.8 | 37.2 | 38.5 |
| විදේශීය ණය පොලී ගෙවීම්/අපනයන (ඈ) | 5.7 | 6.5 | 6.7 | 11.0 |

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2018 සහ 2019 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) 2013 මාර්තු මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගමට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දින කල්පිරුණි.) සහ 2012 ජනවාරි මාසයේ දී රජයේ ආයතන විසින් ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778 ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662 කි.) ඇතුළත් වේ.
(ඈ) භාණ්ඩ හා සේවා අපනයන
(ඉ) ණය ආපසු ගෙවීම් ඇතුළත්ව රජයේ වියදම

ස්වෛරීත්ව බැඳුම්කර මත සිදු කළ පොලී ගෙවීම් හේතුවෙන්, විදේශීය ණය මත පොලී ගෙවීම් 2019 දී පැවති රුපියල් බිලියන 234.0ට සාපේක්ෂව, 2020 වසරේ දී රුපියල් බිලියන 266.7ක් දක්වා ඉහළ නැගුණි. සමස්තයක් ලෙස ගත් කල, දේශීය ණය සේවාකරණ ගෙවීම් 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 1,213.7 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 1,169.5 දක්වා අඩු වූ අතර, විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 808.8 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 771.9 දක්වා සියයට 4.6කින් ද පහත වැටුණි.

**මධ්‍යම රජයේ ණය දර්ශක 2020 වසරේ දී මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය.** සමස්ත ණය සේවාකරණ ගෙවීම්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, පෙර වර්ෂයේ දී පැවති සියයට 13.5 සිට 2020

6

වසරේ දී සියයට 13.0 දක්වා පහත වැටුණි. දේශීය ණය ආපසු ගෙවීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2019 වසරේ දී පැවති සියයට 3.5 සිට 2020 වසරේ දී සියයට 3.0 දක්වා අඩු විය. විදේශීය ණය ආපසු ගෙවීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී පැවති සියයට 3.8 සිට 2020 දී සියයට 3.4ක් දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත පොලී ගෙවීම් 2019 වසරේ දී පැවති සියයට 6.0 සිට 2020 වසරේ දී සියයට 6.5ක් දක්වා ඉහළ ගියේය. විශේෂයෙන්ම, රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික ඇතුළත් දේශීය පොලී අනුපාතිකවල සැලකිය යුතු අඩු වීමක් පැවතිය ද, නොපියවූ දේශීය ණය ඉහළ යාම හේතුවෙන්, දේශීය ණය මත පොලී ගෙවීම්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී පැවති සියයට 4.4 සිට 2020 වසරේ දී සියයට 4.8ක් දක්වා ඉහළ ගියේය. විදේශීය ණය මත පොලී ගෙවීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වූ සියයට 1.6 සිට 2020 වසරේ දී සියයට 1.8ක් දක්වා ඉහළ ගියේය. පෙර වසරට වඩා 2020 වසරේ දී භාණ්ඩ හා සේවාවල සිදු වූ පහත වැටීම හේතුවෙන්, භාණ්ඩ හා සේවා අපනයනවල ප්‍රතිශතයක් ලෙස, විදේශ ණය සේවාකරණ ගෙවීම්, 2019 වසරේ දී පැවති සියයට 23.3 සිට 2020 වසරේ දී සියයට 31.9 දක්වා ඉහළ ගිය අතර, එමගින් විදේශීය ණය සේවාකරණ ගෙවීම්වල පහත වැටීමේ බලපෑම භාණ්ඩ හා සේවා අපනයනවල පහළ යෑමේ බලපෑම අභිබවා යාම පිළිබිඹු කරයි. මේ අතර, 2020 වසරේ දී රාජ්‍ය ආදායමේ සැලකිය යුතු පහත වැටීම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින්, රජයේ ආදායමට මධ්‍යම රජයේ ණය සේවාකරණ වියදම් දක්වන අනුපාතිකය, 2019 වසරේ පැවති සියයට 107.0 සිට 2020 වසරේ දී සියයට 141.9ක් දක්වා පිරිහීමට ලක් විය.

**6.7 සංඛ්‍යා සටහන**
**නොපියවූ රාජ්‍ය ණය (වසර අවසානයේදී)**

| | 2017 | 2018 | 2019 | 2020 (අ) |
|---|---|---|---|---|
| රුපියල් මිලියන | | | | |
| **මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය (ආ)** | **10,382,832** | **12,030,548** | **13,031,543** | **15,117,247** |
| **රජයේ ඇපකර රහිතව රාජ්‍ය ව්‍යවසායයන් ලද විදේශ ව්‍යාපෘති ණය** | **330,221** | **366,130** | **345,453** | **323,510** |
| සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 23,955 | 24,964 | 22,317 | 22,189 |
| ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය | 155,535 | 168,649 | 150,418 | 136,720 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 150,730 | 172,517 | 172,717 | 164,602 |
| **රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය (ඇ) (ඈ)** | **590,492** | **781,741** | **778,305** | **986,391** |
| සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 9,330 | 10,829 | 16,532 | 34,801 |
| ලංකා විදුලි බල මණ්ඩලය | 15,153 | 21,376 | 25,212 | 70,559 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 207,622 | 333,869 | 297,220 | 345,500 |
| සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 11,436 | 13,098 | 12,613 | 12,505 |
| ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 28,060 | 36,843 | 35,311 | 35,562 |
| සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම | 5,886 | 11,000 | 5,398 | 9,692 |
| ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 63,836 | 85,541 | 102,339 | 138,180 |
| වී අලෙවි මණ්ඩලය | 11,087 | 11,436 | 11,420 | 2,023 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 162,701 | 189,022 | 206,563 | 262,015 |
| ශ්‍රීලංකන් ගුවන් සමාගම | 26,750 | 31,981 | 32,083 | 43,530 |
| අනෙකුත් සංස්ථා | 48,631 | 36,746 | 33,615 | 32,023 |
| **රාජ්‍ය ණය** | **11,303,545** | **13,178,418** | **14,155,301** | **16,427,148** |
| ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඉ) | | | | |
| මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය (ආ) | 77.9 | 84.2 | 86.8 | 101.0 |
| රජයේ ඇපකර රහිතව රාජ්‍ය ව්‍යවසායයන් ලද විදේශ ව්‍යාපෘති ණය | 2.5 | 2.6 | 2.3 | 2.1 |
| රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය (ඇ) (ඈ) | 4.4 | 5.5 | 5.2 | 6.6 |
| **රාජ්‍ය ණය** | **84.8** | **92.2** | **94.3** | **109.7** |

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2013 මාර්තු මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගමට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දින කල්පිරුණි.) සහ 2012 ජනවාරි මාසයේ දී රජයේ ආයතන විසින් ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778 ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662 කි.) ඇතුළත් වේ.
(ඇ) මූල්‍ය නොවන රාජ්‍ය ආයතන පමණක් ඇතුළත් වේ.
(ඈ) 2014 ජූනි මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත නිකුත් කරන ලද එ.ජ. ඩොලර් මිලියන 175 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ඇතුළත් වේ. එ.ජ. ඩොලර් මිලියන 175 ක් වූ මෙම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය 2019 ජූනි මාසයේදී කල්පිරුණු අතර, වසර 05 ක කාලයක් සඳහා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් යළි නිකුත් කරන ලදී.
(ඉ) 2018 සහ 2019 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

6

### නොපියවූ රාජ්‍ය ණය

**මධ්‍යම රජයේ නොපියවූ ණය, රාජ්‍ය ව්‍යවසායයන් ලද විදේශ ව්‍යාපෘති ණය[8] සහ රජයේ ඇපකර මත ලබා ගෙන ඇති ණය යනාදියෙන් සමන්විත සමස්ත රාජ්‍ය ණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසර අවසානයට පැවති සියයට 94.3 සිට 2020 වසර අවසානය වන විට සියයට 109.7 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය.** 2020 වසරේ දී නාමික දළ දේශීය නිෂ්පාදිතයේ සිදු වූ සංකෝචනය මෙන්ම මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණයේ සිදු වූ ඉහළ යෑම, මෙම නොපියවූ රාජ්‍ය ණයෙහි වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. නාමික වශයෙන්, සමස්ත නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය 2019 වසර අවසානයට පැවති රුපියල් බිලියන 14,155.3 සිට 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 16,427.1 දක්වා වැඩි විය. සමස්ත රාජ්‍ය ණයෙහි ප්‍රධානතම ණය කාණ්ඩය වන මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2019 වසර අවසානයට පැවති රුපියල් බිලියන 13,031.5 සිට 2020 වසරේ අවසානයට රුපියල් බිලියන 15,117.2 දක්වා ඉහළ ගිය අතර, එය සමස්ත නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 92.0ක් විය. රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය ප්‍රමාණය 2019 වසර අවසානයට පැවති රුපියල් බිලියන 778.3 සිට 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 986.4 දක්වා සියයට 26.7කින් වැඩි වූ අතර, එය සමස්ත රාජ්‍ය ණයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 6.0ක් විය. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසායයන් ලද නොපියවූ විදේශ ව්‍යාපෘති ණය 2019 වසර අවසාන වන විට පැවති රුපියල් බිලියන 345.5 සිට 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 323.5 දක්වා අඩු වූ අතර, 2020 වසරේ දී ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එතෙක් නොපියවා තිබූ ණය පියවා දැමීම මේ සඳහා හේතු විය. රාජ්‍ය ව්‍යවසායයන්ගේ ණයවල ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ණය පවතින අතර, 2020 වසර අවසානය වන විට එම ආයතන දෙරූ ණය ප්‍රමාණය පිළිවෙළින් සියයට 50.9ක් සහ සියයට 42.3ක් විය.



## 6.5 උප රාජ්‍ය ආයතනවල අයවැය කටයුතු

### උප රාජ්‍ය ආයතනවල ප්‍රතිපත්ති දිශාව හා ක්‍රියාමාර්ග

**කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ වුව ද, 2020 වසරේ දී පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලින් සමන්විත උප රාජ්‍ය ආයතන[9] අඛණ්ඩව යටිතලපහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතුවල යෙදුණි.** වසර තුළ දී රටෙහි ආර්ථික යටිතල පහසුකම්වල වැඩි දියුණු වීමක් ඇති කරමින්, පළාත් පාලන ආයතන වැඩි දියුණු කිරීමේ 'පුර නැගුම' ව්‍යාපෘතිය, දේශීය සංවර්ධන සහයෝගීතා ව්‍යාපෘතිය, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක ප්‍රගතියක් පෙන්නුම් කෙරිණි. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සහ පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ද උප රාජ්‍ය ආයතනවල සමාජ යටිතල පහසුකම් නංවාලීමේ අරමුණින් අඛණ්ඩව ක්‍රියාත්මක විය.

**2020 වසරේ දී, මුදල් කොමිෂන් සභාව විසින් රාජ්‍ය ආයෝජන ක්‍රියාවට නැංවීම සහ උප රාජ්‍ය ආයතන මට්ටමින් සේවා සැපයීම තුළින් රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණින් ප්‍රතිපත්ති නිර්දේශ කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** සංවර්ධන කටයුතු සඳහා පළාත් සභා වෙත ඍජුවම අරමුදල් ලබා දෙමින් ජාතික හා උප රාජ්‍ය ආයතනවල තීරණ ගැනීමට අදාළව පොදු රාමුවක් ස්ථාපිත කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබා දෙන ලදී. බොහොමයක් පාරිසරික ආරක්ෂණ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන ආයතන හරහා සිදු කෙරෙන බැවින්, එවැනි කටයුතු සඳහා පළාත් සභාවලට විශේෂ ප්‍රාග්ධන ප්‍රදානයක් සැපයීමට මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කළ අතර, එම කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශවලට සිදු කළ මුදල් වෙන් කිරීම් අත්හිටු වීමට ද නිර්දේශ කෙරිණි. තවද, මධ්‍යම රජයේ අයවැය මත ඇති කරන පීඩනය අඩු කර ගැනීම සඳහා, ආදායම් උත්පාදනය සඳහා නව මාවතක්/ප්‍රවේශයක් හඳුනා ගනිමින්, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සවිබල ගැන්වීමට මුදල් කොමිසම් සභාව විසින් නිර්දේශ කරන ලදී.

### පළාත් සභාවල අයවැය කටයුතු

**වසංගතය මධ්‍යයේ, ආර්ථික ක්‍රියාකාරකම්වල සිදු වූ මන්දගාමී බව පිළිබිඹු කරමින්, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී පළාත් සභාවල ආදායම් රැස් කිරීම සැලකිය යුතු ලෙස පහත වැටුණි.** පළාත් සභාවල සමස්ත ආදායම 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 91.3 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 52.2 දක්වා අඩු විය. මධ්‍යම රජය විසින් ජාතිය ගොඩනැගීමේ බදු ලෙස සිදු කරන ලද පැවරුම් 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 34.9 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 2.7 දක්වා සැලකිය යුතු අඩු වීම පිළිබිඹු කරමින්, සමස්ත බදු ආදායම 2019 වසරේ පැවති රුපියල් බිලියන 81.5 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 43.1 දක්වා පහළ ගියේය. ජාතිය ගොඩනැගීමේ

8 රජයේ ඇපකර රහිතව රාජ්‍ය ව්‍යවසායයන් ලද විදේශ ව්‍යාපෘති ණය

9 2020 වසර අවසානය වන විට, උප රාජ්‍ය ආයතන, පළාත් සභා නවයක් සහ මහ නගර සභා 24ක්, නගර සභා 41ක්, ප්‍රාදේශීය සභා 276කින් යුත් පළාත් පාලන ආයතන 341කින් සමන්විත වේ.

### 6.8 සංඛ්‍යා සටහන
### පළාත් සභාවල අයවැය තත්ත්වය

රුපියල් මිලියන

| ශීර්ෂය | 2017 | 2018 | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|---|---|
| **මුළු ආදායම** | **86,978** | **88,689** | **91,344** | **52,245** |
| බදු ආදායම | 77,691 | 82,228 | 81,499 | 43,096 |
| බදු නොවන ආදායම | 9,287 | 6,461 | 9,845 | 9,149 |
| **මුළු වියදම** | **287,838** | **292,265** | **310,124** | **337,006** |
| පුනරාවර්තන වියදම් | 241,338 | 251,552 | 286,884 | 312,079 |
| එයින් වැටුප් හා වේතන | 187,367 | 198,129 | 219,698 | 239,980 |
| ප්‍රාග්ධන වියදම් | 46,500 | 40,713 | 23,240 | 24,927 |
| **මධ්‍යම රජයේ පැවැරුම්** | **200,860** | **203,576** | **218,780** | **284,761** |
| සාමූහික ප්‍රදාන | 166,348 | 180,095 | 199,968 | 265,593 |
| උපමාන පාදක ප්‍රදාන | 3,236 | 2,462 | 2,205 | 1,752 |
| පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන | 20,250 | 13,536 | 11,376 | 11,004 |
| විශේෂ යෝජනා ක්‍රම සඳහා විදේශීය ප්‍රදාන | 11,025 | 7,483 | 5,230 | 6,412 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මුදල් අමාත්‍යාංශය
පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

බදු ආදායම සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ පැවති සියයට 42.8 සිට 2020 වසරේ දී සියයට 6.3 දක්වා අඩු විය. පළාත් සභාවල ප්‍රධාන ආදායම් මාර්ගය වන දේපළ මත අය කරන බදු ආදායම, 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 32.4ට සාපේක්ෂව 2020 වසරේ දී රුපියල් බිලියන 27.4ක් ලෙස වාර්තා විය. මේ අතර, බදු නොවන ආදායම 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 9.8 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 9.1 දක්වා සුළු වශයෙන් පහළ ගියේය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සිදු කළ සමාජ ආර්ථික කටයුතු සීමා කිරීම හේතුවෙන් අනෙකුත් පළාත්වලට සාපේක්ෂව බස්නාහිර පළාතේ ආර්ථික කටයුතුවලට බාධා ඇති වීම නිසා, සියලුම පළාත් සභා විසින් රැස්කර ගත් සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස බස්නාහිර පළාතෙහි රැස් කරන ලද ආදායම 2019 වසරේ දී පැවති සියයට 49.2 සිට 2020 වසරේ දී සියයට 46.8 දක්වා අඩු විය. අනෙකුත් පළාත් සභා විසින් රැස් කරන ලද ආදායම සැලකූ විට, වයඹ පළාත සහ දකුණු පළාත විසින් රැස් කරන ලද ආදායම සමස්ත ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 10.8ක් සහ 10.5ක් විය.

**2020 වසරේ දී, පළාත් සභාවල සමස්ත වියදම ප්‍රධාන වශයෙන් වැඩි වූයේ පුනරාවර්තන වියදම් වැඩි වීම හේතුවෙනි.** සමස්ත වියදම නාමික වශයෙන් ගත් විට, 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 310.1 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 337.0 දක්වා ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, වැටුප් හා වේතන වැඩි වීම හේතුවෙන් පුනරාවර්තන වියදම 2019 වසරේ පැවති රුපියල් බිලියන 286.9 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 312.1 දක්වා ඉහළ ගියේය. ඒ අනුව, වැටුප් හා වේතන වියදම 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 219.7 සිට 2020 වසරේ රුපියල් බිලියන 240.0 දක්වා වැඩි වූ අතර, එය අඛණ්ඩව පළාත් සභාවල පුනරාවර්තන වියදම් යටතේ වන විශාලතම අයිතමය වෙමින්, පළාත් සභාවල සමස්ත පුනරාවර්තන වියදමින් සියයට 76.9ක් විය. පළාත් සභාවල වැටුප් හා වේතනවලින් සියයට 90ක් පමණ අධ්‍යාපන හා සෞඛ්‍ය අංශ සඳහා විය. මේ අතර, ප්‍රාග්ධන භාණ්ඩ අත්පත් කර ගැනීම මත වියදම, ප්‍රාග්ධන පැවරුම් හා පළාත් විශේෂිත සංවර්ධන ව්‍යාපෘති මත වන වියදම පහළ ගිය ද සමස්ත ප්‍රාග්ධන වියදම් 2019 වසරේ පැවති රුපියල් බිලියන 23.2 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 24.9 දක්වා ඉහළ ගියේය. මුළු පුනරාවර්තන වියදමින් සියයට 23.3කට, සියයට 12.3කට සහ සියයට 11.9කට දායක වෙමින් පිළිවෙළින් බස්නාහිර පළාත් සභාව, මධ්‍යම පළාත් සභාව, දකුණු පළාත් සභාව 2020 වසරේ දී විශාලතම වියදම් දරන පළාත් සභා අතරට පත් විය.

**2020 වර්ෂය තුළ මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත සිදු කරන ලද පැවරුම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන ප්‍රදාන අඩු වුව ද, ප්‍රධාන වශයෙන් සාමූහික ප්‍රදාන වැඩි වීම හේතුවෙන්, මධ්‍යම රජය මගින් සිදු කළ පැවරුම් 2019 වසරේ පැවති රුපියල් බිලියන 218.8 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 284.8 දක්වා ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, මධ්‍යම රජය මගින් සිදු කරන ලද පැවරුම් 2019 වසරේ පැවති සියයට 1.5 සිට 2020 වසරේ දී සියයට 1.9 දක්වා වැඩි විය. මධ්‍යම රජයේ පැවරුම්වල ප්‍රධාන අයිතමය වන පළාත් සභාවල පුනරාවර්තන වියදම් වැඩසටහන්වල ඇති සම්පත් පරතරය පියවීම සඳහා යොදා ගනු ලබන සාමූහික ප්‍රදාන රුපියල් බිලියන 265.6ක් වූ අතර, එය මුළු පැවරුම්වලින් සියයට 93.3ක් විය. මීට අමතරව, විශේෂ ව්‍යාපෘති සඳහා වන ප්‍රදාන 2019 වසරේ පැවති රුපියල් බිලියන 5.2 සිට 2020 වසරේ දී රුපියල් බිලියන 6.4 දක්වා ඉහළ ගියේය. පළාත් විශේෂිත සංවර්ධන ව්‍යාපෘති සහ උපමාන පාදක ප්‍රදාන යටතේ වන පැවරුම් පිළිවෙළින් රුපියල් බිලියන 11.0 සහ රුපියල් බිලියන 1.8ක් විය. වසර තුළ දී, පළාත් සභාවල සැලකිය යුතු පහළ ආදායම් රැස් කිරීම හේතුවෙන් ඒවායේ මුළු වියදමින් සියයට 84.5ක් මූල්‍යනය කරන ලද්දේ මධ්‍යම රජයේ පැවරුම් මගින් වන අතර, එය මධ්‍යම රජයේ අයවැය මත පවත්නා ඉහළ රැඳා පැවතීම පිළිබිඹු කරයි. 2019 වසරේ දී පළාත් සභා විසින් මධ්‍යම රජයේ පැවරුම්වලින් සිදු කළ මූල්‍යනය ඒවායේ මුළු වියදමින් සියයට 70.5ක් විය.

6

6